අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

**Ministry of Internal & Home Affairs and Provincial Councils & Local Government**

පළාත් සභා හා පළාත් පාලන අංශය

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி பிரிவு

**Provincial Councils & Local Government Division**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயல்திறன் அறிக்கை

# Annual Performance Report

# 2018

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පළාත් සභා හා පළාත් පාලන අංශය

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

# පටුන

විධායක සාරාංශය

**1. පළාත් සභා හා පළාත් පාලන අංශයේ සංවිධාන පසුබිම** **7**

1.1. දැක්ම හා මෙහෙවර 9

1.2. විෂයයන් හා කාර්යයන් 10

1.3. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග 11

1.4. පළාත් සභා හා පළාත් පාලන අංශයට අයත් උප අංශ හා ආයතන 12

**2. කාර්ය සාධන සාරාංශය - 2018** **13**

2.1. මූල්‍ය සාරාංශය 15

2.2. භෞතික කාර්යසාධනය සැකෙවින් 16

**3. අමාත්‍යාංශයේ අංශ හා ආයතනවල කාර්ය සාධනය** **21**

3.1. සංවර්ධන හා පුහුණු අංශය 23

3.1.1. සංවර්ධන අංශය 23

3.1.2. පුහුණු අංශය 27

3.2. ව්‍යාපෘති හා සැලසුම් අංශය 28

3.2.1. ප්‍රධාන කාර්යයන් 28

3.2.2. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 29

3.3 ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය 41

3.4 පළාත් පාලන අංශය 44

3.5 පළාත් සභා අංශය 50

3.6 නීති අංශය 53

3.7 පාලන අංශය 54

3.8 මූල්‍ය අංශය 56

3.9 වියදම් විමංසන අංශය 59

3.10 අභ්‍යන්තර විගණන අංශය 62

3.11 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 64

3.12 දේශීය ණය හා සංවර්ධන අරමුදල 70

# විධායක සාරාංශය

මෙම වාර්තාව මඟින් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන විෂය පථයට අදාළව 2018 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද සියලුම දේශීය හා විදේශීය ආධාර සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල හා සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා සංශෝධනය කරන ලද අණපණත් ආදියෙහි කාර්යසාධනය අමාත්‍යාංශයේ එක් එක් අංශ යටතේ විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

ඒ අනුව දිවයිනේ සියළුම පළාත් සභා මෙන්ම මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා සම්බන්ධ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සම්පාදනය, අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණයද, වඩාත් ඵලදායී ලෙස මෙහෙයවීමට හැකි විය.

2018 වසරේ දේශීය හා විදේශීය ව්‍යාපෘති ද ඇතුළුව රුපියල් මිලියන 60,423 ක් පමණ වටිනාකමකින් යුක්ත වූ සංවර්ධන ව්‍යාපෘති සියළුම පළාත් ආවරණය කරමින් ක්‍රියාත්මක කිරීමට හැකි විය. එම ව්‍යාපෘති අතර පළාත් මාර්ග, ග්‍රාමීය මාර්ග, ග්‍රාමීය පාලම්, පළාත් පාලන කාර්යාල, බහු කාර්ය ගොඩනැගිලි, සති පොළ, වෙළඳපොළ සංකීර්ණ, ක්‍රීඩාපිටි හා ළමා උද්‍යාන, වෛද්‍ය සායන ගොඩනැගිලි, ආයුර්වේද මධ්‍යස්ථාන, බස් නැවතුම්පොල, කාණු පද්ධති, පානීය ජල යෝජනා ක්‍රම හා ආදාහනාගාර යනාදිය කැපී පෙනේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වීමෙන් සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමට අඩිතාලම වැටී ඇති බව පැහැදිලි වේ.

පළාත් සභා සහ සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සම්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට අමාත්‍යාංශයට හැකිවී තිබේ. ඒ අනුව පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය සහතික කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් කෙටුම්පත් කිරීම, වතු කම්කරුවන්ගේ සුබසාධනය සැලසීම සඳහා ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම, පළාත් පාලන ආයතන සඳහා ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදී ගිණුම් ක්‍රමයක් හඳුන්වාදීම හා පළාත් පාලන ආයතන සංස්ථාපනය හා උත්ශ්‍රේණිගත කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඇතුලත් නිර්ණායක හඳුන්වාදීම යනාදී ඉතා වැදගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කළ අතර 2019 වසරේදී එහි ප්‍රතිඵල භුක්ති විඳීමට ජනතාවට අවකාශ සැලසෙනු ඇත.

2018 වසරේදී අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යභාරයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සඵල කර ගැනීමට ගරු අමාත්‍ය තුමාගෙන් ලද නායකත්වය හා මාර්ගෝපදේශකත්වය හා ගරු රාජ්‍ය අමාත්‍යවරු දෙපලගෙන් ලැබුණු සහයෝගය මෙන්ම ලේකම්, රාජ්‍ය ලේකම්, අතිරේක ලේකම්වරු, පළාත් ප්‍රධාන ලේකම්වරු, පළාත් පාලන කොමසාරිස්වරු හා සෙසු කාර්යමණ්ඩලයෙන් සැපයුන දායකත්වය කැපී පෙනේ.

# 1

# පළාත් සභා හා පළාත් පාලන අංශයේ සංවිධාන පසුබිම

# 1.1. දැක්ම හා මෙහෙවර

## දැක්ම

කාර්යක්ෂම, සහයෝගීත්ව, නව්‍ය මෙන්ම ජනතාවට වගකියන උසස් හා ගුණාත්මක ප්‍රජා සේවාවන් සපයන පළාත් සභා හා පළාත් පාලන ක්‍රමයක් ඇති කිරීම.

## මෙහෙවර

- ❖ පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීම
- ❖ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ඒවායේ බලතල භාවිතයෙන් සේවාවන් සැලසීම සඳහා ඒවායේ ශක්‍යතාව ඉහළ නැංවීම
- ❖ පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය තුළ පිළිබිඹු වන ජනතා අභිලාෂය තහවුරු කිරීම
- ❖ පළාත් සභා, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන සමඟ සම්බන්ධතා පවත්වමින් සියලු ප්‍රජාවන්ගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම

# 1.2. විෂයයන් හා කාර්යයන්

2018.12.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ විෂයයන් හා කාර්යයන්

- පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයෙහි අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

- පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.

- පළාත් සභා වල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම.

- පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන් සිදුකිරීම.

- පොදු පහසුකම් සංවර්ධන සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීම.

- පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම.

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම.

- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂය කටයුතු.

- පූර්වොක්ත ආයතනයන් අධීක්ෂණය කිරීම.

# 1.3. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

## ප්‍රතිපත්තිය

පළාත්වල ස්වයං තිරසරභාවය තහවුරු කරමින් අන්තර් අසමානතා අඩු කිරීම හා දළ දේශීය නිෂ්පාදිතයන්ට පළාත්වලින් සැපයෙන දායකත්වය වර්ධනය කිරීම.

## උපාය මාර්ග

1. යහපාලන මූලධර්ම පිළිපදිමින් එක් එක් පළාතේ පවත්නා මානව ප්‍රාග්ධන හා පාරිසරික සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සෑම පළාතක ම ආදායම් උත්පාදන හැකියාව වර්ධනය කිරීම.

2. සංක්‍රමණ අනුපාතය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින පළාත්වල එම මට්ටම අවම කිරීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිපත්තීන් හා දීර්ඝකාලීන වැඩසටහන් සම්පාදනය කිරීම සහ හඳුන්වා දීම.

3. රටේ සමස්ත සාමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට දායක වීම සඳහා එක් එක් පළාතේ පවත්නා මානව සම්පත් උපයෝගී කර ගැනීම තහවුරු කිරීම.

4. බිම් මට්ටමේ ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම මගින් පළාත්වල පවතින සම්පත් සජීවීකරණය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ අගයන් හා ශක්‍යතාවන් බලාත්මක කිරීම.

5. එක් එක් පළාතේ පවතින ස්වාභාවික සම්පත්වල තිරසර භාවිතය සහතික කරන අතරේ, ආපදා අවධානම් අවම කිරීමේ හා ආපදා අවස්ථාවලට මුහුණ දීමේ ක්‍රියාමාර්ගයන් ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සමඟ ඒකාබද්ධ කිරීම.

6. මානව සම්පත් සංවර්ධන සහ විද්‍යාත්මක පදනමක් මත පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා සහ පළාත් පාලන පරිපාලන ක්‍රමයක් සහතික කිරීම.

# 1.4. පළාත් සභා පලාත් පාලන අංශයට අයත් උප අංශ හා ආයතන

1. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ කාර්යාලය
2. පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
3. පාලන අංශය
4. අමාත්‍යාංශ ලේකම් කාර්යාලය
    - I. පළාත් පාලන ප්‍රතිසංස්කරණ ඒකකය
    - II. පැමිණිලි හා තොරතුරු ඒකකය
5. පළාත් සභා අංශය
6. පළාත් පාලන අංශය
7. සංවර්ධන හා පුහුණු අංශය
8. ව්‍යාපෘති හා සැලසුම් අංශය
    - I. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
    - II. සැලසුම් ඒකකය
    - III. තොරතුරු තාක්ෂණ ඒකකය
9. නීති අංශය
10. මුදල් අංශය
11. වියදම් විමංසන අංශය
12. අභ්‍යන්තර විගණන අංශය
13. ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
14. මාධ්‍ය ඒකකය
15. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
16. දේශීය ණය සංවර්ධන අරමුදල

# 2

## කාර්යසාධන සාරාංශය - 2018

# 2.1. මූල්‍ය සාරාංශය

| වැඩසටහන | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුව | 2018.12.31 දිනට වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **1,294,192,000** | **922,843,827** |
| පුද්ගල පඩිනඩි | 161,792,000 | 146,443,556 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1,132,400,000 | 776,400,271 |
| | | |
| ප්‍රාග්ධන වියදම් | **16,800,203,000** | **14,139,638,918** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **20,200,000** | **14,850,061** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **7,000,000** | **5,824,842** |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | **632,600,000** | **584,243,887** |
| දේශීය ආධාර ලබන ව්‍යාපෘති | **4,622,950,000** | **3,561,842,526** |
| විදේශීය ආධාර ලබන ව්‍යාපෘති | **11,517,453,000** | **9,972,877,603** |
| | | |
| මුළු එකතුව | **18,094,395,000** | **15,062,482,746** |

2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය 83%

## 2.2. භෞතික කාර්යසාධනය සැකෙවින්

| සංවර්ධන කාර්යය/ක්ෂේත්‍රය | | කාර්ය නිමැවුම |
|---|---|---|
| **පළාත් / ග්‍රාමීය මාර්ග සහ පාලම් සංවර්ධනය** | | |
| 01 | සංවර්ධනය කළ පළාත් මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී. 10 |
| 02 | ඉදිකරන ලද සහ ප්‍රතිසංස්කරණය කරන ලද ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය (තාර, කොන්ක්‍රීට්,බොරළු) | කි.මී. 314 |
| | ග්‍රාමීය මාර්ග යටතේ ඉදිකරන ලද පාලම් / බෝක්කු සංඛ්‍යාව | 07 |
| | ග්‍රාමීය මාර්ග යටතේ ඉදිකරන ලද පැති බැම් සංඛ්‍යාව | 11 |
| 03 | ඉදි කරන ලද ග්‍රාමීය පාලම් සංඛ්‍යාව (මී. 6 සිට මී. 30 දක්වා) | 1247 |

| වාරිමාර්ග සංවර්ධනය (ඉරණමඩු - කිළිනොච්චි) | | |
|---|---|---|
| 01 | වැඩ නිම කරන ලද ප්‍රධාන වාරි ඇළ මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී.30 |
| 02 | වැඩ නිම කරන ලද අනෙකුත් වාරි ඇළ මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී.113 03 |
| 03 | වාරි ඇළ මාර්ග හරහා ඉදිකරන ලද පාලම් / බෝක්කු සංඛ්‍යාව | 15 |
| 04 | ඉරණමඩු ජලාශයේ ප්‍රධාන වේල්ල උස් කොට ඉදිකිරීම හා අලුත්වැඩියා කටයුතු | 100% වැඩ අවසන් |
| 05 | ඉරණමඩු ජලාශයේ වාන් දොරටු සහ පිට වාන පුනරුත්ථාපනය කිරීම | |
| 06 | ඉරණමඩු ජලාශයේ දිය රැළි ආරක්ෂිතයන් (Rip Rap Protection) ඉදිකිරීම | 100% වැඩ අවසන් |
| 07 | ඉරණමඩු උත්සාන වාරිමාර්ග යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම | |

| අපජල ප්‍රවාහන පද්ධති පුනරුත්ථාපනය (කොළඹ මහ නගර සහා බලප්‍රදේශය) | | |
|---|---|---|
| 01 | මුහුදට අපජලය මුදා හරින ප්‍රධාන නල මාර්ග 04 (U1,U3,T34,T36) ප්‍රතිසංස්කරණය කිරීම | 100% |
| 02 | අපජල නල එළීම අවසන් කරන ලද දුර ප්‍රමාණය (M26) | කි.මී. 1.8 |
| 03 | අපජල නල පද්ධතිය පිරිසිදු කිරීම සහ අපජල ප්‍රවාහන පද්ධතියේ තත්ත්ව සමීක්ෂණය CCTV මඟින් අවසන් කරන ලද දුර ප්‍රමාණය | 100% වැඩ අවසන් |

| පළාත් පාලන ආයතන යටිතල පහසුකම් සංවර්ධනය | | |
|---|---|---|
| 01 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද  සතිපොළ සංඛ්‍යාව | 96 |
| 02 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද  වෙළඳ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 38 |
| 03 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද  සංචාරක ආකර්ෂණීය ස්ථාන සංඛ්‍යාව | 17 |
| 04 | ඉදිකරන ලද බස්නැතුම්පොළ / වාහන නැවතුම්පොළ සංඛ්‍යාව | 30 |
| 05 | ස්වයංක්‍රීය කරන ලද පුස්තකාල සංඛ්‍යාව | 14 |
| 06 | ඉදිකරන ලද ආයුර්වේද හා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව | 11 |
| 07 | ඉදිකරන ලද පහසු මධ්‍යස්ථාන සහ පොදු වැසිකිළි ව්‍යාපෘති සංඛ්‍යාව | 11 |
| 08 | ඉදිකරන ලද දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 10 |
| 09 | ඉදිකරන ලද පොදු ගොඩනැගිලි සංඛ්‍යාව | 07 |
| 10 | ඉදිකරන ලද ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 96 |
| 11 | ඉදිකරන ලද අදාහනාගාර සංඛ්‍යාව | 20 |
| 12 | ඉදිකරන ලද උද්‍යාන / ක්‍රීඩාංගන සංඛ්‍යාව | 62 |
| 13 | ඉදිකරන ලද මළ නාලිකා පද්ධති සංඛ්‍යාව | 11 |
| 14 | ඉදිකරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව | 11 |
| 15 | ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 20 |
| 16 | ඉදිකරන ලද කාණු පද්ධති සංඛ්‍යාව | 53 |
| 17 | ස්ථාපිත කරන ලද පෙරටු කාර්යාල සංඛ්‍යාව (පළාත් පාලන ආයතන 101ක් තුළ) | 101 |

| අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය | | |
|---|---|---|
| 01 | ඉදිකරන ලද පාසල් විද්‍යාගාර ගොඩනැගිලි සංඛ්‍යාව | 135 |
| 02 | ඉදිකරන ලද/අලුත්වැඩියා කරන ලද කලාප අධ්‍යාපන කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 30 |
| 03 | ඉදිකරන ලද/අලුත්වැඩියා කරන ලද කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 68 |
| 04 | පාසල් අතර බෙදා දෙන ලද පරිගණක යන්ත්‍ර සංඛ්‍යාව | 16,750 |
| 05 | පරිගණක උපාංග ප්‍රමාණය | 113,900 |
| 06 | කාර්යාල මේස හා පුටු සංඛ්‍යාව | 14,032 |
| 07 | බෙදා දෙන ලද වෑන් හා කැබ් රථ සංඛ්‍යාව | 60 |
| 08 | පාසල් පාදක ගුරු සංවර්ධන,මූල්‍ය හා කළමණාකරණ, ප්‍රසම්පාදන හා පරිසර කළමණාකරණ විෂයය යටතේ පුහුණු වූ නිලධාරීන්, ගුරුවරුන් හා විදුහල්පතිවරුන් | 4590 |

| සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය | | |
|---|---|---|
| 01 | පරිගණකගත දත්ත පද්ධති භාවිතා කරන රෝහල් සංඛ්‍යාව | 196 |
| 02 | රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක පිහිටුවීම හා දැනට තිබෙන හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම | 445 |
| 03 | මාතෘ හා ළමා සෞඛ්‍ය සායන සංඛ්‍යාව | 3646 |
| 04 | ස්ථාපිත සුවදිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව | 31 |
| 05 | සෞඛ්‍ය ජීවන රටා මධ්‍යස්ථාන පිහිටුවීම | 127 |
| 06 | ස්ථාපිත තත්ත්ව කළමනාකරණ ඒකකය පිහිටුවීම | 73 |

| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම | | |
|---|---|---|
| 01 | පළාත් පාලන ආයතන සඳහා බෙදා දෙන ජපන් තාක්ෂණික කොම්පෝස්ට් යන්ත්‍ර සංඛ්‍යාව (Kawashima Machine) | 09 |
| 02 | පළාත් පාලන ආයතන සඳහා බෙදා දෙන ලද කොම්පැක්ටර් යන්ත්‍ර සංඛ්‍යාව | 100 |
| 03 | පළාත් පාලන ආයතන සඳහා බෙදා දෙන ගලිබවුසර් සංඛ්‍යාව | 09 |

| පළාත් සභා සහ පළාත් පාලන ආයතන නීති පද්ධති ප්‍රතිසංස්කරණය | | |
|---|---|---|
| 01 | මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා අණපනත් සංශෝධනය කිරීම. | 90% ක් අවසන් |
| 02 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ සංශෝධන සියල්ල කැටිකොට පරිශීලනය පහසුව සඳහා එක් පනතක් වන ආකාරයෙන් සැකසීම. | අවසන් |
| 03 | 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් සංශෝධන පනතේ තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමේ යෝජනාවලිය සකස් කිරීම. | අවසන් |
| 04 | වතු කම්කරුවන්ගේ සුභසාධනය සැලසීම සඳහා ප්‍රතිපාදන සැලසීමට හැකිවනසේ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම | අවසන් |
| 05 | පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සහ පළාත් සභා ප්‍රඥප්ති සම්පාදන උපදෙස් සංග්‍රහය මුද්‍රණය කොට ප්‍රසිද්ධියට පත් කිරීම | අවසන් |
| 06 | පළාත් සභා ප්‍රඥප්ති පිළිබඳ අධ්‍යයනය කොට පළාත් සභා තුළ ප්‍රඥප්ති පැනවීම සඳහා වන අවශ්‍යතාවයන් හඳුනාගෙන ආදර්ශ ප්‍රඥප්ති සකස් කර දීමේ වැඩසටහන ආරම්භ කිරීම. | අවසන් |
| 07 | මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන වලට සෘජුවම ලබාදීම සම්බන්ධ පනත් කෙටුම්පතක් සකස් කිරීම. | 90% ක් අවසන් |

| අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධනය | | |
|---|---|---|
| 01 | විදේශීය ධාරිතා පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 17 |
| 02 | දේශීය ධාරිතා පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 263 |

| පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් / නිලධාරීන් සඳහා පුහුණුවැඩසටහන් පැවැත්වීම (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය) | | |
|---|---|---|
| 01 | පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළුව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (තාක්ෂණික නිළධාරීන්, වැඩ පරිපාලකවරුන් ඇතුළු අනෙකුත් තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය) | 156 |

| පළාත් පාලන ආයතන සඳහා සහනදායී කොන්දේසි මත ණය සැපයීම (දේශීය ණය සහ සංවර්ධන අරමුදල) | | |
|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති 13ක් සඳහා අනුමත කරන ලද සහනදායී ණය මුදල | රු.මිලියන 1115 |
| 02 | පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති 11ක් සඳහා නිදහස් කරන ලද සහනදායී ණය මුදල | රු.මිලියන 403 |

# 3

# අමාත්‍යාංශයේ අංශ හා ආයතනවල කාර්ය සාධනය

# 3.1. සංවර්ධන හා පුහුණු අංශය

## 3.1.1. සංවර්ධන අංශය

2018 වසරේ සංවර්ධන හා පුහුණු අංශයට වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය 2018.12.31 දින වන විට පහත පරිදි වේ.

### 3.1.1.1 ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

| 2018 ප්‍රතිපාදන | 2018.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1,343,000,000.00 | 1,175,418,577.12 | 87.5% | 94% |

2017 වසරේ ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති 1120ක් ඇතුළුව මෙම වැඩසටහන යටතේ සියළුම පළාත් ආවරණය වන පරිදි 2018 වසරේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 1389ක වැඩ 100%ක් අවසන් කරනලද අතර, ඒ යටතේ ග්‍රාමීය මාර්ග කි.මී. 313.69 ක් සංවර්ධනය කර ඇත. 2018 වසරේ 100%ක් වැඩ අවසන් සංවර්ධන ව්‍යාපෘති 146ක බිල්පත් මෙම අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත් අක්මුදල් නොමැතිකම නිසා ගෙවීම් කිරීමට නොහැකි විය.

### 3.1.1.2. පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ප්‍රාග්ධන වැඩසටහන

| 2018 ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 650,000,000.00 | 598,202,809.75 | 92% | 97% |

2017 වසරේ ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති 640ක් ඇතුළුව මෙම වැඩසටහන යටතේ සියළුම පළාත් ආවරණය වන පරිදි පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 675ක වැඩ 100%ක් අවසන් කර ඇත. 2018 වසරේ 100%ක් වැඩ අවසන් සංවර්ධන ව්‍යාපෘති 35ක බිල්පත් මෙම අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත් අක්මුදල් නොමැතිකම නිසා ගෙවීම් කිරීමට නොහැකි විය.

| අනු අංකය | ක්ෂේත්‍රය |
|---|---|
| 1. | වෙළඳ සංකීර්ණ ඉදි කිරීම |
| 2. | සතිපොළ ගොඩනැගිලි සංවර්ධනය කිරීම |
| 3. | කඩ කාමර ඉදි කිරීම |
| 4. | ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම |
| 5. | පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම |
| 6. | මහජන හා ළමා උද්‍යාන සංවර්ධනය කිරීම |
| 7. | ප්‍රජා ශාලා ඉදිකිරීම |
| 8. | මහජන වැසිකිළි ඉදිකිරීම/සංවර්ධනය කිරීම |
| 9. | ආදාහනාගාර හා පොදු සුසාන භූමි සංවර්ධනය කිරීම |
| 10. | වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීම |
| 11. | සංචාරක ආකර්ශණයක් සහිත ස්ථාන සංවර්ධනය කිරීම |

### 3.1.1.3. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)

| 2018 ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 973,086,000.00 | 640,386,490.83 | 65.8% | 100% |

2017 වසරේ ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති 445ක්ද ඇතුළුව මෙම වැඩසටහන යටතේ සියළුම පළාත් ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීමට අදාළව අනුමත සංවර්ධන ව්‍යාපෘති 450ක වැඩ 100%ක් අවසන් කර ඇත. 2018 වසරේ වැඩ අවසන් සංවර්ධන ව්‍යාපෘති 57ක බිල්පත් මෙම අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත් අක්මුදල් නොමැතිකම නිසා ගෙවීම් කිරීමට නොහැකි විය.

### 3.1.1.4. නැගෙනහිර පළාතේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

| 2018 ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම(රු.) | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 59,050,000.00 | 59,025,418.61 | 11 | 99.9% | 100% |

මේ යටතේ කල්මුණේ ම.න.ස, අක්කරෙයිපත්තු ම.න.ස., මඩකලපුව ම.න.ස, ත්‍රිකුණාමලය න.ස, කින්නියා න.ස, එරාවූර් න.ස, කාත්තන්කුඩි න.ස, පොතුවිල් ප්‍රා.ස. යන පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ නාගරික ප්‍රදේශයන්හි 2017 වසර තුළ ආරම්භ කරන ලද කි.මී. 2.168ක දුරකින් යුත් කාණු පද්ධති සංවර්ධනය කරන ලදී.

** 2017 වසර අවසානයේ බිල්පත් සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම නිසා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි 2017 වසරේ වැඩ නිමකරන ලද සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව හිඟ බිල්පත් නිරවුල් කිරීම පිණිස 2018 වසරේ අයවැය ප්‍රතිපාදන භාවිතා කරන ලදී.*

### 3.1.1.5. වන්දනාකරුවන් සඳහා ගිමන්හල් ස්ථාපිත කිරීම (පහසු මධ්‍යස්ථාන ඉදිකිරීම)

2018 අයවැය යෝජනා මගින් වන්දනාකරුවන් සඳහා අනුරාධපුරය, ශ්‍රී පාදය, නල්ලූර්, මඩු, මුන්නේෂ්වරම් සහ කෝනේෂ්වරම් යන ස්ථානවල ගිමන්හල් ඉදිකිරීමේ වැඩසටහන සඳහා මෙම අමාත්‍යාංශය යටතේ රු.මිලියන 100ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

ඉහත ස්ථාන අතුරින් නල්ලූර් සහ මුන්නේෂ්වරම් යන පූජනීය ස්ථානවල අදාළ ඉදිකිරීම් සඳහා සුදුසු ඉඩම් පිළිබඳව පැවති ගැටළු හේතුවෙන් එම ස්ථානවල ගිමන්හල් ඉදිකිරීම (පහසු මධ්‍යස්ථාන ඉදිකිරීම) ආරම්භ කිරීමට නොහැකි විය.

ඒ අනුව, අනුරාධපුර හා ශ්‍රී පාදය යන පූජනීය ස්ථානවලට අදාළ පහසු මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් වන ගෘහ නිර්මාණාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම්, විස්තරාත්මක ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම ඊට අදාලව තෝරාගෙන ඇති උපදේශන ආයතනය වන රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද අතර එහි මේවන විට ප්‍රසම්පාදන කටයුතුද අවසන් අදියරේ ක්‍රියාත්මක වෙමින් පවතී. 2019 වසර මුල ඉහත ස්ථාන දෙක හා මඩු සහ කෝනේෂ්වරම් යන ස්ථානවලට අදාළව ප්‍රසම්පාදන කටයුතු නිමකර ඉදිකිරීම් කටයුතුද ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ආගමික ස්ථානවලට වන්දනාකරුවන් සහ දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බැවින් වර්තමාන අවශ්‍යතාවයන්ට, අදාළ ප්‍රදේශයන්ට හා භූමියේ පිහිටීමට ගැළපෙන අයුරින් පහත සඳහන් කර ඇති පහසුකම් සහිතව පහසු මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙමගින් පළාත් පාලන ආයතනවල වාර්ෂික ආදායම ඉහළ නංවා ගැනීමටද අවස්ථාවක් උදාවනු ඇත.

| සැපයෙන පොදු පහසුකම් | |
|---|---|
| **පහසු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල** | **අදාළ භූමිය තුළ** |
| **ගිමන් නිවා ගැනීමට අදාළ පහසුකම් සහිත ප්‍රවේශ ශාලාව<br>ආපනශාලාව<br>වැසිකිළි පහසුකම්<br>නෑම සඳහා අවශ්‍ය නානකාමර<br>ඇඳුම් මාරු කිරීම සඳහා ස්ථාන<br>ආබාධිත පුද්ගලයින් සඳහා අවශ්‍ය ප්‍රවේශ පහසුකම්** | **වාහන නැවැත්වීම සඳහා පහසුකම්<br>භූමිය තුළ රැදී සිටීමේ ආවරණ සහිත කුටි හා බංකු<br>ආරක්ෂිත වැට<br>අපජලවහන පද්ධතිය<br>වැසිජල කාණු පද්ධති<br>මුරකුටිය<br>කුඩා ළමුන් සඳහා සෙල්ලම් මිදුල** |

### 3.1.1.6. පුස්තකාල සංවර්ධන වැඩසටහන 2018

පුස්තකාල සංවර්ධන වැඩසටහනට අදාළව 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන රු.මි. 25.00 උපයෝගී කරගෙන පහත සඳහන් ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

1. පුස්තකාල 14ක් ස්වයංක්‍රීයකරණය කිරීම
2. කොළඹ මහජන පුස්තකාල පරිශ්‍රයේ මහජන විද්‍යුත් පුස්තකාල මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

### 3.1.1.6.1. පුස්තකාල 14 ක් ස්වයංක්‍රීයකරණය කිරීම

***හැඳින්වීම***

කාලාන්තරයක් තිස්සේ මහජන පුස්තකාලවල භාවිත කෙරෙන සාම්ප්‍රදායික ක්‍රමවේදයන් වෙනුවට නවීන තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ක්‍රමවේද භාවිත කරමින් කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක සේවාවක් පුස්තකාල පාඨකයන් වෙත සැපයීමේ පරමාර්ථයෙන් දිවයිනේ පළාත් පාලන ආයතන අනුබද්ධිත මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කළ අතර එය 2017 වර්ෂයේදී නිම කරනු ලැබිණි. පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ ප්‍රවීන රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණික විශේෂඥ සහාය ඇතිව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. සමෝධානිත සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුගතවූ පුස්තකාල පරිගණක යෙදවුම් භාවිතය සහිත ස්වයංක්‍රීයකරණය කෙරෙහි මහජන පුස්තකාල දිරිගැන්වීම පිණිස අවශ්‍ය කරන දෘඩාංග, මෘදුකාංග, පුහුණුව හා සම්පත් ලබා දීමට මේ ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ලැබිණි.

එම ව්‍යාපෘතියේ සාර්ථක අත්දැකීම් පදනම් කරගෙන 2018 වර්ෂයේදී පළාත් පාලන ආයතන පුස්තකාල 14ක් ස්වයංක්‍රීයකරණය කිරීමට කටයුතු කෙරිණි.

***ආයෝජනය***

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 5.4ක් තාක්ෂණික උපදේශන සේවා සඳහා යොදවනු ලැබෙන අතර, අදාළ තාක්ෂණික උපකරණ 2017 වර්ෂයේ උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් සපයනු ලැබ ඇත.

***ස්වයංක්‍රීයකරණය කෙරෙන පුස්තකාල ලැයිස්තුව***

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | පුස්තකාලය / පළාත් පාලන ආයතනය |
|---|---|---|---|
| 1 | දකුණු | මාතර | දෙනියාය මහජන පුස්තකාලය / කොටපොල ප්‍රාදේශීය සභාව |
| 2 | | | කිරින්ද මහජන පුස්තකාලය / කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව |
| 3 | නැගෙනහිර | අම්පාර | පදියතලාව මහජන පුස්තකාලය / පදියතලාව ප්‍රාදේශීය සභාව |
| 4 | ඌව | බදුල්ල | බණ්ඩාරවෙල මහජන පුස්තකාලය/ බණ්ඩාරවෙල මහ නගර සභාව |
| 5 | වයඹ | පුත්තලම | හලාවත මහජන පුස්තකාලය / හලාවත නගර සභාව |
| 6 | උතුරු | යාපනය | නල්ලූර් මහජන පුස්තකාලය / යාපනය මහානගර සභාව |
| 7 | උතුරු මැද | පොළොන්නරුව | හිඟුරක්ගොඩ බණ්ඩාරනායක මහජන පුස්තකාලය / හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව |
| 8 | බස්නාහිර | කොළඹ | දෙහිවල ගල්කිස්ස මධ්‍යම පුස්තකාලය/ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව |
| 9 | | | මොරටුව මහජන පුස්තකාලය/ මොරටුව මහ නගර සභාව |
| 10 | | | පාදුක්ක බණ්ඩාරනායක මහජන පුස්තකාලය / සීතාවක ප්‍රාදේශීය සභාව |
| 11 | | | නුගේගොඩ මහජන පුස්තකාලය/ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව |
| 12 | | | අතුරුගිරිය මහජන පුස්තකාලය/ කඩුවෙල මහ නගර සභාව |
| 13 | | | බෙල්මන්ට් මහජන පුස්තකාලය / කොළඹ මහා නගර සභාව |
| 14 | මධ්‍යම | මහනුවර | තැන්නෙකුඹුර මහජන පුස්තකාලය / මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය සභාව |

### 3.1.1.6.2. මහජන විද්‍යුත් පුස්තකාල මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

පුස්තකාල ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය යටතේ ස්වයංක්‍රියකරණ කරන ලද හා ඉදිරි වර්ෂවලදී ස්වයංක්‍රියකරණය කරනු ලැබෙන පළාත් පාලන ආයතන අනුබද්ධිත පුස්තකාල ජාලගත කෙරෙන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම 2017 වර්ෂයේ පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අතර එය 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරී. මේ සඳහා ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ තාක්ෂණික විශේෂඥ සේවය ලබා ගැනිණි.

***ආයෝජනය***

- තාක්ෂණික සේවා ලබාගැනීම සඳහා - රු.මි. 1.4
- මධ්‍යස්ථාන පරිශ්‍රයේ නවීකරණ කටයුතු සඳහා රු.මි. 3.3
- තාක්ෂණික උපකරණ හා කාර්යාලයීය භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මි. 8.2

ප්‍රගතිය (2018-12-31 දිනට)

| ව්‍යාපෘතිය | භෞතික | මූල්‍ය |
|---|---|---|
| **1. පුස්තකාල 14 ක් ස්වයංක්‍රීයකරණය ස්ථාපනය කිරීම** | **98%** | **රු.මි.4.2 ක බිල්පත් ලැබී ඇත** |
| **2. මහජන විද්‍යුත් පුස්තකාල මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම** | **95%** | **රු.මි. 9 ක බිල්පත් ලැබී ඇත.** |

**3.1.1.7. කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආයෝජන ව්‍යාපෘති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.**

මහනගර සංවර්ධන හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ කොළඹ මහ නගර සභාව එක්ව කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව සම්බන්ධීකරණ කටයුතු මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

1. ෂැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය යටතේ මළ නාලිකා පද්ධති, අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග හා විදුලි යටිතල පහසුකම් සැපයීම.
2. කොළඹ වරාය නගරය සඳහා වන මළ නාලිකා පද්ධතිය ඉදිකිරීම. (චෛතිය පාර සිට නව බාලදක්ෂ මාවත දක්වා.)

## 3.1.2. පුහුණු අංශය

2018 වර්ෂයේ පුහුණු අංශය යටතේ වෙන් වූ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ 2018.12.31 දින වන විට පහත පරිදි වේ.

| 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **2,000,000.00** | **1,785,486.25** | **89 %** |

පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 48

සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව - 263

# 3.2. ව්‍යාපෘති හා සැලසුම් අංශය

මෙම අංශය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය, සැලසුම් ඒකකය හා තොරතුරු තාක්ෂණ ඒකකය මගින් සමන්විත වී තිබේ.

### *දැක්ම*

අමාත්‍යංශයේ සියළු කටයුතු වල උපායමාර්ග සැලසුම් සම්පාදක වීම සහ විදේශ ව්‍යාපෘති සඳහා තනාපතිවරයෙකු වීම.

### *ප්‍රධාන අරමුණු*

1. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන මගින් සේවා හා යටිතල පහසුකම් වගවීමකින් හා වගකීමකින් යුතුව ලබාදීමට සහාය වීම.
2. ග්‍රාමීය ජනතාවගේ ජනජීවිතයේ ගුණාත්මකභාවය වැඩිකිරීමට අවශ්‍ය සම්පත් ලබාදීම.

## 3.2.1. ප්‍රධාන කාර්යයන්

### 3.2.1.1. ව්‍යාපෘති හා කළමනාකරණ ඒකකය

1. විදේශාධාර ව්‍යාපෘතිවලට අදාල කාර්යයන් රේඛීය අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, ව්‍යාපෘති කළමණාකරණ ඒකක හා වෙනත් ආයතන සමග සම්බන්ධීකරණ කිරිම තුළින් ව්‍යාපෘතිවල අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කිරිම.
2. ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය පසු විපරම් කිරීම.
3. ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.
4. ව්‍යාපෘති වලට අදාළ කැබිනට් පත්‍රිකා සකස් කිරීම.
5. ව්‍යාපෘති කාර්යය මණ්ඩල බඳවා ගැනීම ඇතුළු පරිපාලන කටයුතු සිදු කිරීම.
6. අමාත්‍යංශයේ අනෙකුත් අංශ අතර නිසි සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
7. විදේශ ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
8. විදේශ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම.

### 3.2.1.2. සැලසුම් ඒකකය

1. අමාත්‍යංශ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස්කර අදාළ ආයතනවලට ඉදිරිපත් කිරීම.
2. අමාත්‍යංශ ප්‍රගති වාර්තා මාසිකව, කාර්තුමය හා වාර්ෂික ලෙස සකස් කිරීම හා අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.
3. අමාත්‍යංශ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
4. නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම.

5. වාර්ෂික කාර්යය සාධන වාර්තාව සැකසීම හා පාර්ලිමේන්තු අයවැය කාරක සභා අවස්ථාවට අවශ්‍ය කාර්යසාධනය හා ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව සැකසීම.

**3.2.1.3. තොරතුරු තාක්ෂණ ඒකකය**

1. අමාත්‍යංශ නිල වෙබ් අඩවිය සතිපතා යාවත්කාලීන කිරීම.
2. තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම හා තොරතුරු එක්රැස් කිරීම.
3. අන්තර්ජාල පහසුකම් පවත්වා ගෙන යාමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදිම.
4. අමාත්‍යංශයේ සියලු අංශ වලට හා නිළධාරින්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සහය ලබාදීම.
5. ඉ-පළාත් පාලන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

මෙම අංශය යටතේ, මේ වන විට විදේශාධාර ව්‍යාපෘති 11 ක් පමණ ක්‍රියාත්මක කරමින් පවතී. එම ව්‍යාපෘතිවල කාර්යය මණ්ඩලය 500 පමණ සේවය කරන අතර සියලුම පළාත් ආවරණය කරමින් අදාල පළාත් සභා හරහා ඒවා ක්‍රියාත්මක වේ. මෙම විදේශාධාර ව්‍යාපෘතිවල සම්පූර්ණ ආයෝජනය රු. මිලියන 158,702.39 කි. විවිධ මූල්‍ය ආයතන මගින් ණය හා ප්‍රදාන ලෙස එම ආයෝජන සිදු කර ඇත.

## 3.2.2. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

### 3.2.2.1. පුරනැගුම (අතිරේක ප්‍රතිපාදන)

**අරමුණ**

**නිදන්ගත වකුගඩු රෝග ව්‍යාප්තව ඇති ප්‍රදේශ තුළ ජල සම්පාදන ව්‍යාපෘති වැඩි දියුණු කිරීම මගින් රෝග ව්‍යාප්තිය අඩු කිරීම හා පළාත් පාලන ආයතනවල ධාරිතාවය වැඩි කිරීම හා ක්‍රියාකාරකම් ප්‍රති නිර්මාණය මගින් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම.**

**ව්‍යාපෘති සංරචක**

1. නිදන්ගත වකුගඩු රෝග අඩු කිරීම සඳහා පානීය ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරීම
2. පළාත් පාලන ආයතන මගින් සපයන සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකිරීමට හැකිවන පරිදි එම ආයතන යටතේ පාලනය වන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
3. පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය කිරීම හා ඒවායේ ධාරිතාව වැඩි කිරීම

| | | | |
|---|---|---|---|
| | ණය ආධාර ලබාදෙන ආයතනය | ආසියානු සංවර්ධන බැංකුව | |
| | ව්‍යාපෘති පිරිවැය (රු. මිලියන) | 10,180.00 | |
| | ව්‍යාපෘති කාලය | 2017-2020 | |
| | ක්‍රියාත්මක ප්‍රදේශ | බස්නාහිර, වයඹ, දකුණ, ඌව, මධ්‍යම, උතුරු මැද යන පළාත් | |
| | 2018 ප්‍රතිපාදන රු.මි. | 1860.6 | |
| | 2018.12.31 දිනට මූල්‍ය ඉලක්ක/ප්‍රගතිය | 1860.6 | 1822.6 |
| | 2018.12.31 දිනට භෞතික ඉලක්ක/ප්‍රගතිය | 55% | 51% |

| අතිරේක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ වැඩසටහන් | ඉදිකිරීමට යෝජිත ප්‍රමාණය | අතිරේක ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට යෝජිත යටිතල උප ව්‍යාපෘති වැඩසටහන් | ඉදිකිරීමට යෝජිත ව්‍යාපෘති ගණන |
|---|---|---|---|
| ප්‍රදානය කළ හා ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින ව්‍යාපෘති (පානීය ජල යෝජනා ක්‍රම) | 19 | සෞඛ්‍ය මධ්‍යස්ථාන | 04 |
| | | පොදු වෙළඳපොළ | 06 |
| | | ආදාහනාගාර | 01 |
| ලංසු කැඳවා කොන්ත්‍රාත් ප්‍රදානය කරන අවස්ථාවේ පවතින ව්‍යාපෘති (පානීය ජල යෝජනා ක්‍රම) | 06 | සතිපොළ | 02 |
| | | පුස්තකාල | 02 |
| ලංසු කැඳවා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ඇති පානීය ජල ව්‍යාපෘති | 01 | ශ්‍රවනාගාර | 02 |
| | | පළාත් පාලන කාර්යාල ගොඩනැගිලි | 14 |
| **එකතුව** | 26 | **එකතුව** | **31** |

මීට අමතරව ප්‍රාදේශීය සභා මගින් සපයන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටුකිරීමට හැකිවන පරිදි එම ආයතන යටතේ පාලනය වන යටිතල පහසුකම් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම, වරිපනම් ඇතුළු අනෙකුත් බදු අය කිරීමේ හා 'බලපත්‍ර' නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටි සරල කිරීම හා ඒවා අනුමත කිරීමේ ක්‍රමවේදය වඩාත් විනිවිදභාවයකින් ඉටුකිරීමට හැකිවන පරිදි ප්‍රාදේශීය සභාවන්හි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම ජනතාවගේ කාර්යයන් පහසු කිරීම සඳහා පරිගණක පහසුකම් සහිත පෙරටු කාර්යාල

## 3.2.2.2. මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

***සංරචකය 01*** - කොළඹ මහා නගර සභාව තුළ ගැටළු සහගත සහ අර්බුදකාරී මළ නාලිකා (10නප) පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම ඇතුළුව තෝරාගත් මළ නාලිකා සඳහා CCTV විමර්ශන දියත් කිරීම, තත්වය පිළිබඳ තක්සේරු වාර්තා ලබා ගැනීම සහ වත්කම් කළමනාකරණ දත්ත ගබඩාවක් ලෙස සංවර්ධනය කිරීම.

***නිම කරන ලද ක්‍රියාකාරකම් 2018***

i. M26 මළ නාලිකාව ඉදිකිරීම 88.21% පයිප්ප ඇති කිරීම නිම කර ඇත.

ii. R1 - (බ්‍රේබෲක් පෙදෙස) මළ නාලිකාව ඉදිකිරීම - 50% පමණ කාර්යයක් මේ වන විට නිමකර ඇත.

iii. සෙරන්ඩිබ් පෙදෙස මළ නාලිකාව ඉදිකිරීම - 90% පමණ කාර්යයන් මේ වනවිට නිම කර ඇත.

iv. මේවනවිටත් කොළඹ මහා නගර සභාවට අයත් CS19 මළ නාලිකාව අළුත්වැඩියා කිරීමට සහය දීම.

v. මේවනවිටත් කොළඹ මහා නගර සභාව තුළ පවතින මළ නාලිකාවල Spot අළුත්වැඩියාවන් open cut - 98.4% සහ trenchless - 100% ක්‍රම භාවිතා කර ඉටු කිරීම.

vi. තෝරාගත් මළ නාලිකාවල CCTV වාර්තා සැකවීම 92% පමණ කාර්යයන් මේවන විට නිම කර ඇත.

***සංරචකය 02 -*** පොම්පාගාර ස්ථාන 10 ක් වැඩිදියුණු කිරීම / ඉදි කිරීම, අධීක්ෂණ පාලන තත්ව ලබාගැනීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම. කොළඹ මහා නගර සභාවේ ජල අපවහන කොට්ඨාශය වෙත SCADA පද්ධතිය හා පොම්පාගාර 14ක් සම්බන්ධ කොට නව ප්‍රධාන අධීක්ෂණ ඒකකය පිහිටුවීම.

## *නිම කරන ලද ක්‍රියාකාරකම් 2018*

i. බම්බලපිටිය පොම්පාගාරය ඉදිකිරීම - 90.05% ඉදිකිරීම් අවසන්, වනාතමුල්ල - 83.37% ඉදිකිරීම් අවසන්, කොම්පඤ්ඤ වීදිය - 83.50% ඉදිකිරීම් අවසන්, කී - 82.18% ඉදිකිරීම් අවසන්.

ii. මාලිගාවත්ත සහ තිඹිරිගස්යාය පොම්පාගාරයන්හි Secant වසකසබට ඉදිකිරීම.

iii. වනාතමුල්ල සහ Vystwyke යන ස්ථාන වල පීඩන නලමාර්ග ඉදිකිරීම. වනාතමුල්ල - 29.8% ඉදිකිරීම් අවසන්, Vystwyke - 15% ඉදිකිරීම් අවසන්.

iv. වැඩ ඒකකය ඉදිකිරීම - සියළු ඉදිකිරීම් අවසන් කොට ඇත.

## 3.2.2.3. මහ කොළඹ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - (GCWWMIIP)

අදියර 2 සහ අදියර 3

**නිම කරන ලද ක්‍රියාකාරකම් 2018**

1. සංස්ථායික ප්‍රවර්ධන උපදේශනය යටතේ කොළඹ මහා නගර සභාවේ අපජල පවහන අංශයේ කාර්යය මණ්ඩලය සඳහා පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

   i. අභ්‍යසනය පුහුණු කිරීමේ සැලසුම

   ii. කාර්යය සැලසුම

   iii. අවධානම ඇගයීමේ මාර්ගයක්

   iv. මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාර්යය සංග්‍රහයක්

   v. සනීපාරක්ෂක මළ නාලිකා පිටාර ගැලීමේදී ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම

   vi. 5S පුහුණු වැඩසටහන

   v. අභිප්‍රේරණය ඇතිකිරීමේ පුහුණු කඳවුර

2. කිරුළපන ජල ධාරක ප්‍රදේශය තුල නව ගුරුත්ව මළ නාලිකා, පීඩන නල මාර්ග සහ පොම්පාගාරයන් ඇති කිරීම. මළ නාලිකා නොමැති ප්‍රදේශ වල මළ නාලිකා එලීම ආරම්භ කර ඇත.

3. කිරුළ නාරහේන්පිට ප්‍රදේශය තුල ඉදිකිරීම - කිරුළ නාරහේන්පිට ප්‍රදේශය මළ නාලිකා නොමැති ප්‍රදේශයට සවිස්තර සැලසුම, පොම්පාගාර 1ක් ඇතුළුව අපජල පවහන පද්ධතියක් ලබා දීම.

# 3.2.2.4 උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)

## හැඳින්වීම සහ අරමුණු

මුල් ව්‍යාපෘතියේ සාර්ථකත්වය පදනම්ව ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ආසියානු සංවර්ධන බැංකුව විසින් උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියට අතිරේක මූල්‍ය ණයක් ලෙස ඇ.ඩො. මිලියන 68ක ණය ආධාරයක් දිවයිනේ උතුරු කොටසේ තෝරා ගත් ජාතික හා පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ලබා දී ඇත. එයින් ඇ.ඩො. මිලියන 30ක් පළාත් සංරචකය යටතේ උතුරු සහ උතුරු මැද පළාත් වල තෝරා ගත් පළාත් මාර්ග කි.මී. 125ක් පුනරුත්ථාපනය කිරීම සඳහා සහ උතුරු සහ උතුරු මැද පළාත් මාර්ග ආයතනයන් ශක්තිමත් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරිණි.

**ණය විස්තර**

**ණය අංකය** (2890 SRI (SF) - අතිරේක ප්‍රතිපාදන

**මුළු ව්‍යාපෘති වියදම** ඇ.ඩො. මිලියන 30 (පළාත් සංරචකය සඳහා) රජයේ අනුග්‍රහය - ඇ.ඩො. මිලියන 4.87

| | **2012 ජූලි 23-25** |
|---|---|
| ණය ගිවිසුම අත්සන් කිරීම | **2012 නොවැම්බර් 19** |
| ණය ක්‍රියාත්මක වීමේ දිනය | **2013 මැයි 31** |
| ණය ලබා දීම අවසාන වන දිනය | **2019 දෙසැම්බර් 31** |

**මෙහෙයවීමේ ආයතනය**

පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආයතනය ලෙස ක්‍රියාත්මක වේ.

**ක්‍රියාත්මක කිරීමේ ආයතනය**

උතුරු පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනයන් ලෙස කටයුතු කරනු ලැබේ.

**ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2018/2019**

අතිරේක මූල්‍යනය යටතේ උතුරු මැද පළාතේ මාර්ග කොන්ත්‍රාත් 05ක් ද උතුරු පළාතේ මාර්ග කොන්ත්‍රාත් 04ක් ද පිරිනමා වැඩ නිම කර ඇත. මෙම නිම කරන ලද කොන්ත්‍රාත්තු වල අවුරුදු 05ක කාලයක් සඳහා එම මාර්ග නඩත්තු කටයුතු අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින්ම ඉදිරියට කරගෙන යාමට නියමිතව ඇත.

**භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2018 සැප්තැම්බර් 30 දක්වා**

| | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | | | භෞතික ප්‍රගතිය (රු.මි) | |
|---|---|---|---|---|---|
| | වෙන් කිරීම් | වියදම | ප්‍රතිශතය % | % | % |
| ක්‍රියාත්මක කිරීමේ ඒකකය | 11.23 | 8.34 | 74.26% | | |
| උතුරු පළාත | 249.76 | 248.05 | 99.31% | 100% | 100% |
| උතුරු මැද පළාත | 50.56 | 48.06 | 95.05% | 100% | 100% |

**ව්‍යාපෘතිය නඩත්තු කිරීමේ කටයුතු අධීක්ෂණය**

මේවනවිට නඩත්තු කටයුතු අධීක්ෂණය උතුරු පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා උතුරු මැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය කරගෙන යනු ලබයි.

## 3.2.2.5 යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

1. ව්‍යාපෘති නාමය : යාපනය කිළිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ඉරණමඩු සංරචකය (JKWSSP-IC)

2. අරමුණ : ඉරණමඩු ජලාශයේ මූලස්ථාන වැඩ ශක්තිමත් කර වැඩිපුර ජලය ආරක්ෂිතව රඳවා තැබීමට සහතික කිරීම.

3. මූල්‍යාධාර : ආසියානු සංවර්ධන බැංකුව (ණය අංකය : 2710 - 2711) හා ශ්‍රී ලංකා රජය ආ.ස.බැ. = ඇ.ඩො.මිලියන 12.93 හා ශ්‍රී. ල. ර. = ඇ.ඩො.මි.3.41

4. ක්‍රියාකාරකම් : ඉරණමඩු ජලාශයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම හා තිරුවයිආරු උස්සාන් වාරි මාර්ග යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම.

5. නිමැවුම් : මූලස්ථාන වැඩ කටයුතු පුනරුත්ථාපනය කර ධාරිතාවය හා මීටර මිලියන 17 ක් වැඩි කිරීම (හා මීටර 131 සිට 148 දක්වා) හා තිරුවායිආරු උස්සාන් වාරිමාර්ග යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම.

6. ප්‍රතිඵල : ඉරමඩු ආරක්ෂිත මූලස්ථාන වැඩ හා යල කන්නයේ වගා වැඩි වීම.

7. කාල සීමාව : 2011 මැයි 6 සිට 2018 දෙසැම්බර් දක්වා

8. ව්‍යාපෘති අධීක්ෂණ ආයතනය : පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය.

9. ක්‍රියාත්මක ආයතනය : උතුරු පළාත් සභාව සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

10. ව්‍යාපෘති කළමණාකරණ ඒකකය : අර්ධකාලීන නිලධාරීන් 17 කින් සමන්විතය.(ව්‍යාපෘති අධ්‍යක්ෂක, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, ඉංජිනේරුවරයා, මූල්‍ය සහකාර, කළමණාකරණ සහකාර, තාක්ෂණ නිලධාරී, සැලසුම් ශිල්පී)

11. උපදේශකවරු : එම්.බී. උපදේශකවරු, බංගලාදේශ ආයතනය අනුබද්ධ M/S ඉන්ෆොටෙක්ස් අයිසියාන් ප්‍රයිවට් ලිමිටඩ් ශ්‍රී ලංකා.

12. උපදේශකවරුන්ගේ රාජකාරිය : විමර්ශන හා නිරීක්ෂණ සිදු කිරීම, සංවර්ධන යොජනා සැකසීම, ව්‍යාපෘති නිර්මාණය කිරීම, ඇස්තමේන්තු සැකසීම සහ ඉදිකිරීම් සුපරීක්ෂණය කිරීම.

## 3.2.2.6. ද්විතීයික සෞඛ්‍ය අංශික සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP)

*ව්‍යාපෘති පසුබිම*

**දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP)** ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක්වන ලෝක බැංකු ණය ආධාර යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද පස් වාර්ෂික ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ වී 2018 සැප්තැම්බර් මස අවසන් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලාංකාව තුළ සෞඛ්‍ය ආරක්ෂණයෙහි ගුණාත්මකභාවය, ප්‍රවේශය සහ ප්‍රාදේශීය විෂමතාව අවමකිරීම, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ අරමුණු අතර ප්‍රධාන වේ.

**ව්‍යාපෘති සංවර්ධන අරමුණ (PDO)** : මහජන සෞඛ්‍ය පද්ධතියෙහි කාර්යසාධන ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ මන්දපෝෂණය සහ බෝ නොවන රෝග යන අභියෝග සඳහා වඩාත් හොඳින් ප්‍රතිචාර දැක්වීමට හැකියාව සැලසීම.

| | |
|---|---|
| ආධාර ලබාදෙන ආයතනය | **ලෝක බැංකුව** |
| **මුළු ව්‍යාපෘති වියදම** | **රු.මි.** 26,000 (**ඇ.ඩො.**200) |
| **ව්‍යාපෘති කාලය** | 2013 -2018 |
| **ව්‍යාපෘති ප්‍රදේශය** | **සමස්ත දිවයින** |
| **ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන්** | **රටෙහි සමස්ත ජනගහණය** |

*ප්‍රධාන ක්ෂේත්‍ර*

i. මාතෘ සහ ළමා සෞඛ්‍ය සහ පෝෂණය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ii. බෝවන රෝග වැළැක්වීම සහ පාලනය

iii. බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය

iv. සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමට කටයුතුකිරීම

**සමස්ත කාර්යසාධනය**

වියදම් සම්බන්ධ නිර්ණායක 9ක් සහ වියදම් සම්බන්ධව නොවන නිර්ණායක 11ක් පදනම් කරගෙන ව්‍යාපෘතියෙහි සමස්ත කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට බඳුන් කරනු ලැබිණි. එසේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන නිර්ණායක පහත දක්වා ඇත.


| භෞතික ප්‍රගතිය | සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව | ඉලක්කය | ඉලක්ක ඉටුකරගැනීම |
|---|---|---|---|
| සංවර්ධනය කළ හදිසි ප්‍රතිකාර ඒකක (ETUs), | 445 | 50% | 82% |
| සංවර්ධනය කළ මාතෘ සහ ළමා සෞඛ්‍ය සායන ( MCH) | 3646 | 95% | 95% |
| ස්ථාපිත සුවදිවි මධ්‍යස්ථාන ( HLCs) | 311 | 90% | 94% |
| මරණ සහ රෝග වාර්තාකිරීමේ පද්ධති ක්‍රියාත්මක සෞඛ්‍ය ඒකක (EIMMR) | 446 | 70% | 82% |
| ස්ථාපිත තත්ත්ව කළමනාකරණ ඒකක ( QMUs,) | 73 | 90% | 95% |

## මූල්‍ය ප්‍රගතිය


| ව්‍යාපෘති අගය | පළාත් සඳහා යෙදවූම් මූල්‍ය | මූල්‍ය භාවිතාව |
|---|---|---|
| Rs. 26,000 Mn | Rs. 15,163.20 Mn | Rs. 14,028.00 Mn |

## 2018 වර්ෂයේ ප්‍රගතිය දෙසැම්බර් මස 31 දිනට

මූල්‍ය ප්‍රගතිය




භෞතික ප්‍රගතිය



## 3.2.2.7. ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**ව්‍යාපෘතියේ අරමුණු**

1. රටේ ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ජනතාවගේ සංචලනය සහ ජීවන තත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම
3. ග්‍රාමීය ප්‍රදේශ වල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් නව නිෂ්පාදන අවස්ථා සඳහා ඔවුන්ගේ දේශීය දැනුම භාවිතයට ගැනීම

| | අදියර I | අදියර II | අදියර III |
|---|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය | නෙදර්ලන්තය |
| ව්‍යාපෘති පිරිවැය (රු. මිලියන ) | 7,400.00 | 22,600.00 | 16,500.00 |
| ව්‍යාපෘති කාලය | 2013-2016 | 2014-2018 | 2014-2018 |
| ක්‍රියාත්මක ප්‍රදේශ | සමස්ත දිවයින පුරා | | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 100% | 98% | 97% |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) | 7372.87 | 22,246.11 | 16,258.83 |
| 2018 හතරවන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය (රු. මිලියන) | | 1500/2568.03 | 1000/1811.51 |
| 2018 හතරවන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | වැඩ අවසන් වී ඇත | 100%/98.4% | 100%/97.4% |

| මූල්‍ය සහය | මුළු පිරිවැය | 2018 සඳහා වෙන්කළ ප්‍රතිපාදන (රු.මි.) | ඉදිකෙරෙන පාලම් සංඛ්‍යාව | වැඩ නිමි සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (2018 රු.මි.) | සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මි. | සමස්ත භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය (අදියර I) | 7,400 | | 210 | 210 | | 7372.87 | 100% |
| එක්සත් රාජධානිය (අදියර II ) | 22,600 | 1500 | 618 | 582 | 2568.03 | 22,244.71 | 98% |
| නෙදර්ලන්තය (අදියර III ) | 16,500 | 1000 | 490 | 455 | 1529.71 | 15,977.03 | 97% |
| එකතුව | 46,500.00 | 2500 | 1318 | 1250 | 4,380.94 | ,45,877.81 | |

මේ ව්‍යාපෘතියේ පළමු අදියරෙහි වැඩ අවසන් වී ඇත. දෙවන අදියර යටතේ වැඩ අවසන් නොවූ පාලම් 36 සහ තෙවන අදියර යටතේ වැඩ අවසන් නොවූ පාලම් 35 ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 3.2.2.8. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP)

ලෝක බැංකුවේ මූල්‍යාධාර යටතේ රු.මි. 13,000ක පිරිවැයක් දරමින් 2012 - 2018 කාලසීමාව තුළ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියෙන් සියලූ පළාත් අවරණය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රථමික සහ ද්විතීක අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීමයි. භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය 100% කි.

අධ්‍යාපන අමාත්‍යංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබූ අතර, පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබුවේ අදාළ පළාත් සභාව, පළාත් අධ්‍යාපන අමාත්‍යංශය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහාය. පළාත් පාලන, පළාත් සභා හා ක්‍රීඩා අමාත්‍යංශය විසින් ව්‍යාපෘතියේ පළාත් සභාවලට අදාළ වැඩ කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබීය

- මෙම ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික විද්‍යාගාර 135, පන්ති කාමර ගොඩනැගිලි 705ක්, කලාප අධ්‍යාපන කාර්යාල 30ක් සහ කොට්ඨාශ අධ්‍යාපන කර්යාල 58ක් පමණ ඉදිකිරීම් අවසන් කර තිබේ.
- දළ වශයෙන් පරිගණක යන්ත්‍ර 16750ක්, ස්කෑනර්, ප්‍රින්ටර් යනාදී පරිගණක උපාංග 13650ක්, පන්ති කාමර ඩෙස්ක් සහ පුටු 113900ක්, කාර්යාල මේස සහ පුටු 14032ක්, කාර්යාල උපකරණ (ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර මල්ටිමීඩියා උපකරණ යනාදිය) 1410 ක් පමණ හා වාහන 60 (කැබ් රථ, වෑන් රථ) මිලදී ගෙන බෙදා දී ඇත.
- මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන, පරිසරය කළමනාකරණය, පාසැල් පාදක කළමනාකරණය, පාසැල් පාදක ගුරු සංවර්ධනය යන තේමා යටතේ පළාත් සභා නිලධාරීන්, විදුහල්පතිවරුවන් සහ ගුරුවරුන් 4590ක් පමණ පුහුණු කොට ඇත.

2017 ජුනි මස අවසන් වීමට නියමිතව තිබු මෙම ව්‍යාපෘතිය 2018 ජුනි දක්වා වසරකින් දීර්ඝ කරන ලද අතර එම කාල සීමාවේදී පෙර වසර වලින් ඉදිරියට ගෙන ආ කාර්යයන් නිම කරන ලදී.

## 3.2.2.9. නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)

**ව්‍යාපෘතියේ අරමුණ**

උතුර, නැගෙනහිර, උතුරු මැද සහ ඌව යන පළාත්වල හඳුනාගත් ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම, පානීය ජල පහසුකම් සැපයිම සහ සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග වැඩිදියුණු කිරීම ඔස්සේ එම ප්‍රදේශ වල ජනයාගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමත් එමගින් එම ප්‍රදේශවල ආර්ථිකය නඟා සිටුවීම හා පවතින ආර්ථික සංවර්ධනයේ ප්‍රාදේශිය විශමතාවන් අවමකිරීම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මෙහිදී රජයේ 2015 ආර්ථික ප්‍රතිපත්තිය සහ 2016 හා 2017 වසර වල අයවැය ප්‍රකාශයන්ට අනුව වසර තිහක් පැවති පීඩාකාරී වාතාවරණයෙන් පීඩාවට පත් පළාත් යළි නඟා සිටුවීමටත් එම ප්‍රදේශවල පවතින සංවර්ධනයේ විශමතාවය අවම කිරීමත් සමස්ථයක් ලෙස ඌණ සංවර්ධනයක් සහිත පළාත්වල ආර්ථික සංවර්ධනය තුළින් දුගී බව අවම කිරීමත් අරමුණු කර ඇත.

විශේෂයෙන්ම 2017 වර්ෂය ණිදුගී බව පිටු දැකීමේ වසරට ලෙස නම් කර ඇති පසුබිමක එම අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා ව්‍යාපාතියේ සංවර්ධන ඉලක්ක අභිමුඛ කොට තිබේ.

- **ව්‍යාපෘතියේ කාලසීමාව**

  2017 ජුලි මස සිට 2021 දෙසැම්බර් දක්වා ආසන්න වශයෙන් වසර 5ක කාල සීමාවකි

- **ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බල ප්‍රදේශය**

  උතුරු පළාත, උතුරු මැද පළාත, ඌව පළාත සහ නැගෙනහිර පළාත

- **ව්‍යාපෘති ප්‍රදේශ තෝරාගැනීමේදී පදනම් කරගත් නිර්ණායක**

  පළාත් මට්ටමින් දළ දේශිය නිෂ්පාදනයට දක්වන දායකත්ව මට්ටම (GDP Share index)

  ප්‍රාදේශිය සභා/පළාත් පාළන ආයතන බල ප්‍රදේශවල දරිද්‍රතා මට්ටම

- **පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත උප ව්‍යාපෘති**

| | පළාත | | | | |
|---|---|---|---|---|---|
| උප ව්‍යාපෘති | උතුර | උතුරු මැද | නැගෙනහිර | ඌව | එකතුව |
| කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | **50** | **28** | **25** | **18** | **121** |
| ග්‍රාමිය මාර්ග නවිකරණය/වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | **85** | **40** | **44** | **55** | **224** |
| පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | **8** | **27** | **15** | **23** | **73** |
| එකතුව | **143** | **95** | **84** | **96** | **418** |

### ව්‍යාපෘතියේ මූල්‍ය පදනම

| | විදෙස් මුදල් (ජපන් යෙන් මිලියන) | | | දේශීය මුදල් (රුපියල් මිලියන) | | | එකතුව (ජපන් යෙන් මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Total | JICA | GOSL | Total | JICA | GOSL | Total | JICA | GO`SL |
| උතුරු පළාත | 0 | 0 | 0 | 3,200 | 3,200 | 0 | 2,259 | 2,259 | 0 |
| නැගෙනහිර පළාත | 0 | 0 | 0 | 3,200 | 3,200 | 0 | 2,259 | 2,259 | 0 |
| උතුරු මැද පළාත | 0 | 0 | 0 | 3,200 | 3,200 | 0 | 2,259 | 2,259 | 0 |
| ඌව පළාත | 0 | 0 | 0 | 3,200 | 3,200 | 0 | 2,259 | 2,259 | 0 |
| Price escalation | 0 | 0 | 0 | 2,123 | 2,123 | 0 | 1,499 | 1,499 | 0 |
| Physical contingency අනපේක්ෂිතා වියදම් | 0 | 0 | 0 | 746 | 746 | 0 | 527 | 527 | 0 |
| උපදේශන සේවා | 0 | 0 | 0 | 1,516 | 1,516 | 0 | 1,070 | 1,070 | 0 |
| පරිපාලන වියදම් | 0 | 0 | 0 | 859 | 0 | 859 | 607 | 0 | 607 |
| VAT බදු | 0 | 0 | 0 | 2,578 | 0 | 2578 | 1,820 | 0 | 1,820 |
| ඉදිකිරීම් කාලසීමාව තුළ පොලී ගෙවීම | 825 | 825 | 0 | 0 | 0 | 0 | 825 | 825 | 0 |
| Front-end fee ආරම්භක වියදම් | 26 | 0 | 26 | 0 | 0 | 0 | 26 | 0 | 26 |
| Total | 851 | 825 | 26 | 20,622 | 17,185 | 3,437 | 15,410 | 12,957 | 2,452 |

### ව්‍යාපෘතියේ මූල්‍ය පදනම

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) මඟින් ලබාදෙන ජපන් යෙන් මිලියන දොළොස්දහස් නවසිය පනස් හතක් ණය (¥12,957,000,000) මුදල් සහ ශ්‍රී ලංකා රජයෙන් සපයන මිලියන තුන්දහස් හාරසිය තිස් හතකි.

### ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය හා ආයතනික ව්‍යුහය

පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කොළඹ පිහිටුවා ඇති අතර එහි ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ යටතේ ව්‍යාපෘති කළමණාකරන කාර්ය මණ්ඩලය සේවයට පත්කර ඇත. සෑම පළාතකම පළාත් සභාවන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස වගකීම දරන අතර සෑම පළාතකම පළාත් ලේකම් යටතේ පිහිටුවන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක පවති.

මෙම ඒකක වල පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කරනු ලබන්නේ අදාල පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ක්‍රම සම්පාදන වන අතර, පළාත් පාලන කොමසාරිස්වරයා සහ අදාළ පළාතේ වාරිමාර්ග අධ්‍යක්ෂ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියා කරයි.

ව්‍යාපෘතියේ සමස්ථ උපදේශන කාර්යය සඳහා උපදේශන ආයතන දෙකක් යටතේ කාර්යමණ්ඩලය පත්කරන අතර, එහි ප්‍රධානීන් වන කණ්ඩායම් නායකවරුන් දෙදෙනා ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ යටතේ ව්‍යාපෘති

කළමනාකරණ ඒකකයෙහි ස්ථානගත වන අතර, සෑම පළාතකම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක තුළ නේවාසික ඉංජිනේරුවරුන් හා ඔවුන්ට අදාල කාර්ය මණ්ඩලයක් සේවයට යොදවනු ලැබේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අදාළ ප්‍රදේශයේ ප්‍රජාවගේ මූලිකත්වය සහිතව සිදුකරන අතර, හඳුනා ගන්නා ලද උප ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් කරුවන් මඟින් සිදුකරනු ලැබේ. ඉදිකිරීම් අවසන් වූ පසු නඩත්තු හා මෙහෙයුම් ප්‍රජා සංවිධාන හෝ පළාත් පාලන ආයතන වෙත පැවරීමට නියමිතය.

## ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය

2018 ඔක්තෝම්බර් මස 15 වන දින වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය:

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක හතරක් ස්ථාපිත කොට ඇත.
- උපදේශන ආයතන තෝරා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරට පැමිණ ඇත.

  පානීය ජල ව්‍යාපෘතින් සඳහා වන උපදේශන කාර්යයට අදාළ උපදේශන ආයතනය තෝරා ගැනිමේ කටයුතු අවසන් ව ඇති අතර ජනාධිපති අභියාචන කමිටු වාර්තාව ලැබුණු පසු එය කැබිනට් අනුමැතියට යොමු කිරීමට නියමිතය.
- ග්‍රාමීය මාර්ග සහ කුඩා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා වන උපදේශන ආයතනය ලෙස තෝරාගත් ආයතනය ජයිකා ආයතනයේ අනුමැතිය සඳහා යොමුකර ඇත.
- පළාත් මට්ටමේ උප ව්‍යාපෘති ප්‍රදේශ වල ප්‍රජා දැනුවත් කිරිම් සහ මූලික තොරතුරු එක් රැස් කිරීම් අවසන් අදියරෙහි පවති.
- පළාත් මෙහෙයුම් කමිටුව පිහිටුවා පළමු රැස්වීම පවත්වා ඇත.

## 2018 දෙසැම්බර් 31 වන දින වනවිට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ පරිපාලන වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ අරමුදල් (GOSL) වලින් මිලියන 57.768 වැයවී ඇත. මෙම මුදල් පළාත් හා ප්‍රධාන කාර්යාල පිහිටුවීම, කාර්යාල උපකරණ මිළදී ගැනිම් සහ කාර්ය මණ්ඩල වැටුප් ගෙවිම් සඳහා වැයවී ඇත. විදෙස් (JICA) අරමුදල් වලින් මේ වන තෙක් වැයවීමක් සිදුවී නැත.

අංගය 01. ග්‍රාමීය මාර්ග සහ කුඩා, හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘති

අංගය 02. පානීය ජලපහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

## ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය / 2018 වසර තුළ නිමකළ කාර්යයන්

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක හතරක් ස්ථාපිත කොට ඇත.
- උපදේශන ආයතන තෝරා ගැනීම ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරට පැමිණ ඇත.

  පානීය ජල ව්‍යාපෘතීන් සඳහා වන උපදේශන කාර්යයට අදාළ උපදේශන ආයතනය තෝරා ගැනිමේ කටුයුතු අවසන්ව ඇති අතර, එය කැබිනට් අනුමැතියට යොමුකිරීමට නියමිතය.

  මාර්ග සහ වාරිමාර්ග ව්‍යාපෘතිවලට අදාළ උපදේශන ආයතනය තෝරාගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර, එය ජනාධිපති ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලයේ ඇගයීමට යොමුකිරීමට නියමිතය.
- ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව හා පළාත් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු පිහිටුවා මූලික හමුව පවත්වා ඇත.
- ව්‍යාපෘතියේ දැනුවත් කිරිමේ සැලසුම සකස්කොට එයට අනුකූලව පළාත් මට්ටමේ රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
- හඳුනාගත් උප ව්‍යාපෘති ඇතුළත් ව්‍යාපෘති බල ප්‍රදේශයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික තොරතුරු එක්රැස් කිරීම සිදුකර ඇත.

# 3.3. ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

**දැක්ම** : සැමට වඩාත් සුවපහසු පරිසරයක්

**අරමුණ** : පළාත් පාලන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**කාර්යභාරය :**

- පළාත් පාලන ආයතන සඳහා විධිමත් හා යෝග්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් හඳුන්වාදීම පිණිස නීති සම්පාදනය හා උපදේශන සැපයීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නවීන තාක්ෂණික සහාය පළාත් පාලන ආයතන වෙත ලබාදීම හා පුහුණු වැඩමුළු සංවිධානය
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දේශීය හා විදේශීය අත්දැකීම් හුවමාරුකර ගැනීමෙහි ලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම
- රාජ්‍ය නොවන සංවිධාන හා මූල්‍ය ආයතනයන්ගෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාගැනීමට සහායවීම
- පළාත් පාලන ආයතන සඳහා කසල කළමනාකරණයට අවශ්‍ය ගොඩනැගිලි, වාහන, යන්ත්‍ර සූත්‍ර හා යටිතල පහසුකම් ලබා දීම
- 3R ක්‍රමවේදය වැඩිදියුණු කිරීම ( Reduce, Reuse, Recycle)
- දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
    - ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සෞඛ්‍ය කම්කරු නිලධාරින් වෙනුවෙන් හැකියා වර්ධන පුහුණු වැඩමළු පැවැත්වීම. (ජාතික පුහුණු සහතිකය ලබා දීම* (National Vocational Qualification NVQ 2)
    - කොම්පෝස්ට් සකස් කිරීමේ නව ක්‍රම වේදයක් වන තකකුරා ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාහන හා උපකරණ ලබාදීම
    - පළාත් 09 ම ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන සඳහා කසල ප්‍රවාහන යන්ත්‍ර මළ අපද්‍රව්‍ය ප්‍රවාහන යන්ත්‍ර ආදිය ලබාදීම.
- දේශිය අරමුදල් යොදාගෙන කම්පැක්ටර් රථ 100ක් මිලදී ගැනීම
- කොරියානු ණය ආධාර යටතේ කම්පැක්ටර් රථ 190ක් මිලදී ගැනීම.

**විශේෂ ව්‍යාපෘති**

- ජපන් තාක්ෂණික කොම්පෝස්ට් යන්ත්‍ර ස්ථාපනය කිරීම.
- දැනට ශ්‍රී ලංකාවතුල කම්කරු ශ්‍රමය යොදාගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය සිදුකරන අතර එම ක්‍රමය වෙනුවට යාන්ත්‍රික ක්‍රමවේදයන් යොදාගෙන නිෂ්පාදනය කාර්යක්ෂම කිරීම.
- දිවයිනේ පළාත් 09ම ආවරණය වන පරිදි යන්ත්‍ර ස්ථාපනය කිරීමට කටයුතු කර ඇති අතර එම යන්ත්‍රයක් මගින් දිනකට කසල ටොන් 50ක් කොම්පොස්ට් කිරීම සිදු වේ. පළාත් පාලන ආයතන (50)ක පමණ දිරන කසල සඳහා විසඳුමක් මෙමගින් ලැබෙන අතර මෙහි නිෂ්පාදිත ගුණාත්මක තත්වයෙන් ඉහළ කොම්පෝස්ට් සඳහා වෙළඳ පොළක් හඳුන්වා දීමට ද කටයුතු කරමින් පවතී.

| **පළාත** | **යන්ත්‍රය ස්ථාපිත කරනු ලබන ස්ථානය** |
|---|---|
| බස්නාහිර පළාත | බේරුවල නගර සභාව මහජන විරෝධතා හේතුවෙන් ගාල්ල නගර සභාව වෙත ලබා දෙන ලදී. |
| උතුරු මැද පළාත | ලංකාපුර ප්‍රාදේශීය සභාව - සුංගාවිල කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමිය |
| මධ්‍යම පළාත | දඹුල්ල, මහ නගර සභාව - දිගම්පතහ ප්‍රදේශය |
| සබරගමුව පළාත | කෑගල්ල නගර සභාව - ආඩියාහේන කසල බැහැර කරන ස්ථානය |
| දකුණු පළාත | හම්බන්තොට නගර සභාව - කැලියපුර කසළ බැහැර කරන ස්ථානය |
| වයඹ පළාත | කුරුණෑගල නගර සභාව - සුන්දරාපොළ කසළ බැහැර කරන ස්ථානය |
| නැගෙනහිර පළාත | අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව - අස්රප් නගර් කසළ බැහැර කරන ස්ථානය |
| ඌව පළාත | බදුල්ල ප්‍රාදේශීය සභාව - වේවැස්ස වත්ත (මහජන විරෝධත මත අතහැර දැමීමට සිදුවිය) එම ව්‍යාපෘතිය නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි නගර සභාවට ලබා දෙන ලදී. |
| උතුරු පළාත | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව - වඩමාරච්චි නිරිත කසළ බැහැර කරන ස්ථානය |

- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල කසළ කළමනාකරණ කටයුතු සඳහා කාර්ය සාධක බලකායක් හා මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම
    - මහජනතාවගේ පැමිණිලි ලබාගැනීම සඳහා 1917 යන දුරකථන අංකය ස්ථාපිත කර ඇත.
    - ලැබෙන පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ පරිසර පොලිස් නිලධාරීන් විසින් අවශ්‍ය කටයුතු සිදුකිරීම .
    - අවිධිමත් කසළ බැහැර කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි ලැබීමේ දී ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු පරිසර පොලීසිය මඟින් සිදුකිරීම.
    - ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් විසින් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල මාර්ගවල හා අතුරු මාර්ගවල අනවසර කසළ බැහැර කිරීම, මාර්ගයේ පවතින අනතුරු දායක තත්වයන් පිළිබඳ වාර්තාවන් ඉදිරිපත් කිරීම හා නිවැරදි කිරීමට අදාළ ආයතන වෙත යොමු කිරීම.

## ඩෙංගු මර්ධන වැඩසටහන

දිවයිනේ ඩෙංගු අවදානම් සහිත පරිසරයන් අවම කිරීමට ආයතන දැනුවත් කරමින් අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කර, ඒවා අඛන්ඩව ක්‍රියාත්මක කිරීමට සහාය දීම මඟින් ඩෙංගු වලින් තොර පරිසරයක් ගොඩනැගීමට පළාත් පාලන ආයතන වලට සහාය වීම.

***ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රගතිය (2018.12.31 දිනට) ජාතික ඝන අපද්‍රව්‍යය කළමනාකරණ ව්‍යාපෘතිය***

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වටිනාකම (රු. මි ) | සත්‍ය (රු.මි) | වියදම | සත්‍ය භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 01 | **2017** වර්ෂයේ නොගෙවූ බිල්පත් හා අවිච්ඡේද සඳහා | **585** | **569.3** | | **100%** |
| **02** | ජපන් තාක්ෂණික කොම්පෝස්ට් යන්ත්‍ර ස්ථාපිත කිරීම | 665 | 281.2 | | 75% |
| **03** | කම්පැක්ටර් 100 මිලදී ගැනීම | 600 | | | 90% |
| **04** | රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා වන ව්‍යාපෘතිය | 50 | | | 20% |
| **එකතුව** | | 1900 | 850.5 | | |

# 3.4. පළාත් පාලන අංශය

## 01. අරමුණ

ප්‍රාදේශීය සම්පත් හා ශක්තීන් ගොණු කර ප්‍රාදේශිය අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ස්වයං උත්පාදන ආයතනයක් බවට පත්වීමේ අභිලාශයෙන් තමන් වෙත පැවරී ඇති කාර්යය හා බලතල සාර්ථකව ක්‍රියාත්මක කරන පළාත් පාලන ආයතන බිහි කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ නියාමනයක් කිරීම.

### උපාය මාර්ගඃ

1. යහපාලන මූලධර්ම මත පිහිටා එක් එක් පළාත් තුළ පවත්නා මානව ප්‍රාග්ධනය හා භෞතික සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් ආදායම් ප්‍රභවයන් වඩාත් ශක්තිමත් කිරීම.
2. බාහිර සංක්‍රමණ අනුපාතය සාපේක්ෂව වඩා ඉහළ මට්ටමක පවත්නා පළාත් පාලන ආයතනයන්හි එකී අනුපාතයන් අවම කිරීමට සුදුසු ප්‍රතිපත්ති හා දිගුකාලීන වැඩසටහන් හඳුන්වා දීම.
3. ශ්‍රී ලංකාවේ සමස්ත සමාජ, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි සුරක්ෂිත බව උදෙසා එක් එක් පළාතෙහි පවත්නා මානව සම්පෙතහි උපයෝගීතාවය වඩාත් තහවුරු කිරීම

## 02. පසුගාමී පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

පළාත් පාලන ආයතනවල "වාර්ෂික ආදායම්" යන නිර්ණායකය මත පමණක් පදනම් වී මිලියන 10ට අඩු වාර්ෂික ආදායමක් සහිත පළාත් පාලන ආයතන පසුගාමී පළාත් පාලන ආයතන ලෙස සළකමින් මේ දක්වා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙල සංශෝධනය කොට පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා) 271ක් සැලකිල්ලට ගනිමින් අදාළ සමාජ ආර්ථික අංශ නියෝජනය වන නිර්ණායක 20ක් සඳහා ලකුණු ලබාදී ඇගයීමට ලක් කිරීම මඟින් පළාත් පාලන ආයතන 100ක් ''පසුගාමී පළාත් පාලන ආයතන'' ලෙස තෝරා ගන්නා ලදී.

එම පසුගාමී පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රභවයන් වර්ධනය කිරීම මඟින් සංවර්ධන පසුබිම දිර්ඝ කාලීනව ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව තෝරා ගත් පසුගාමී පළාත් පාලන ආයතන සියය තුළින් පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘති ක්ෂේත්‍ර හතරකට අදාළ ව්‍යාපෘති යෝජනා කැඳවීමෙන් මෙම ''ආදායම් උත්පාදක වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය'' සඳහා සුදුසු ව්‍යාපෘති තෝරා ගන්නා ලදී.

i. වෙළඳ සංකීර්ණ ඉදිකිරීමට අදාළ ව්‍යපෘති

ii. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යපෘති.

iii. කුඩා නගර / ජනාකීර්ණ ප්‍රදේශ ආශ්‍රිතව වැසිකිළි පහසුකම් වැඩි දියුණු කිරීමට අදාළ ව්‍යාපෘති.

iv. ආදායම් උත්පාදනය කළ හැකි වෙනත් ව්‍යාපෘති.

## 2.1. 2018 වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති

### ව්‍යාපෘතියේ මුළු වටිනාකම - රු.මි.100

### 2.1.1 සීතාවක ප්‍රාදේශීය සභාව

- ව්‍යාපෘති නාමය - තුන්නාන පොදු සුසාන භූමියේ ආදාහනාගාරයක් ඉදිකිරීම.
- ව්‍යාපෘති ප්‍රධාන අරමුණ - සීතාවක ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාරවල ඇතිවිය හැකි කාර්මික දෝෂවලට විකල්පයක් සැපයීම සහ ආදාහනය සඳහා ඇති වන තදබදය වළක්වා ගැනීම.
- ව්‍යාපෘතියේ සෙසු අරමුණු - I ආදාහනාගාර සේවාව පුළුල් කිරීම.

  II. හෝමාගම ප්‍රාදේශීය සභා ආදාහනාගාර

  යොමුවිය හැකි අවස්ථාවන් මෙම ආදාහනාගාරයට යොමුවීම හා ඒ තුළින් සභා ආදායම වැඩි කිරීම.
- ව්‍යපෘතියේ අගය - රු.මිලියන 17.8
- සෘජු හා වක්‍ර ප්‍රතිලාභින් සංඛ්‍යාව - 18,000 ක් පමණ

### 2.1.2 අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව

- **ව්‍යාපෘති නාමය** : මැටිහක්ක පැරණි පුස්තකාල ගොඩනැගිල්ල ව්‍යාපාරික ස්ථානයක් බවට සංවර්ධනය කිරීම.
- ව්‍යාපෘති ප්‍රධාන අරමුණ :

  i. ප්‍රාදේශීය සභාවේ ආදායම් මට්ටම 5% කින් ඉහළනැංවීම.

  ii. ප්‍රාදේශීය සභාවේ වත්කම් නිසි ලෙස සංවර්ධනය කිරීම.

  iii. මහජනතාවගේ පොදු උපයෝගීතා සේවා ඉහළ නැංවීම.

  iv. ජනතාවගේ මූලික අවශ්‍යතා සඳහා නගරයට ඇදී යාම අවම කිරීම.

  v. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

- **ව්‍යාපෘතියේ මුළු වටිනාකම** : රු.මිලියන.19.72
- **සෘජු හා වක්‍ර ප්‍රතිලාභයන් සංඛ්‍යාව** : 2000 ක් පමණ.

## 03. අයාලේ යන සුනඛයන්ගෙන් මහජනතාවට සිදුවන අවහිරතා වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සැකසීම

අයාලේ යන සුනඛයන්ගෙන් මහජනතාවට සිදුවන අවහිරතා වැළැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2016.04.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යන අමාත්‍යාංශය තුනෙහි ලේකම්වරුන්ගේ සමන්විත ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, යථෝක්ත කමිටුව විසින් පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නිර්දේශ ඉදිරිපත් කොට ඇත.

i. සුනඛ ගහණය පාලනය සම්බන්ධව පළාත් පාලන ආයතනයට නීතියෙන් පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන්.

ii. 2012 වසරේ අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මතුවී තිබූ බාධාවන්.

iii. පළාත් සභා තුළට මෙම ව්‍යුහය ඇතුළත් කිරීමේදී පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිශ්චිත කාර්යභාර්යන් ලෙස මෙය හඳුනා ගැනීම.

iv. ප්‍රතිපාදන වෙන් කිරීම.

v. සුනඛ රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.

vi. දැනට දිවයින පුරා සිටින සුනඛයින් පිළිබඳ සංගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාව.

එබැවින්, සුනඛ ඒන්නත්කරණය හා වන්ධ්‍යාකරණ වැඩසටහන 2018 අප්‍රේල් මස 01 දින සිට සම්පූර්ණයෙන්ම සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයෙන් ඉවත් කර ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැවරූ අතර සියලු පළාත් සභා යටතේ විශේෂ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මේවන විට එම වැඩසටහනෙහි ප්‍රගති සමාලෝචනය සඳහා නැවත තොරතුරු කැඳවා ඇත.

## 04. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය / උත්ශ්‍රේණිගත කිරීම

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංස්ථාපනය සම්බන්ධව පිළිගත් ක්‍රමවේදයන් හෝ ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා අලුතින් පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම මෙන්ම පවත්නා පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණට වූ බැවින් සහ එය ශ්‍රී ලංකාවේ නාගරීකරණ අනුපාතය පහළ අගයක් (18.25 - 2012 ජන සංගණනය අනුව) පෙන්නුම් කිරීමෙහිලා වක්‍රාකාරයෙන් බලපානු ලබන හෙයින් නව පළාත් පාලන ආයතන සංස්ථාපනය හා පවත්නා පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් ඊට අදාළව ජාතික නිර්ණායක පද්ධතියක් නිර්දේශ කිරීම සඳහා එවකට පළාත් සභා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් 2016.05.25 දින සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කරන ලදී.

ඒ අනුව, නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමේදී සහ පවතින පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීමේදී පහත සඳහන් මූලික කරුණු, නිර්ණායක ලෙස පිළිගත යුතු බව එම කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර එම මූලික නිර්ණායක යටතේ ඇති සංවර්ධන දර්ශක 42ක් මත බර තැබීම සිදු කොට ලකුණු ලබා දීම සිදු කරයි.

i. ජන සංඛ්‍යාව හා ජන ඝනත්වය.

ii. නිවාස ප්‍රමාණය හා ඝනත්වය.

iii. සේවා සම්පාදනය හා යටිතල පහසුකම්වල දියුණුව.

iv. වාණිජ හා කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය.

v. සේවා නියුක්තිය.

vi. යෝජිත ආයතනයේ බල ප්‍රදේශයේ ස්වයං ජනිත ආදායම.

එලෙස ලබා ගනු ලබන ලකුණු ප්‍රතිශතය මත යම් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය /උත්ශ්‍රේණිගත කිරීමේ හැකියාව පිළිබඳ පහත පරිදි තීරණය කළ හැකිය.

i. ලකුණු 80% ට වැඩි වන අවස්ථාවක - සංස්ථාපනය /උත්ශ්‍රේණිගත කිරීම සිදු කළ හැකිය.

ii. ලකුණු 70%- 80% අතර වන අවස්ථාවක - සුවිශේෂී කරුණු පවතිනම් ඒ පිළිබඳව සලකා බලා සංස්ථාපනය/ උත්ශ්‍රේණිගත කිරීම සිදු කළ හැකිය.

iii. ලකුණු 70% ට අඩු වන අවස්ථාවක - සංස්ථාපනය /උත්ශ්‍රේණිගත කිරීම සිදු කළ නොහැකිය.

ඒ අනුව ඉහත සඳහන් විද්‍යාත්මක ක්‍රමවේදය මත පදනම්ව 2017 වර්ෂයේ දී ප්‍රාදේශීය සභා 06ක් පහත සඳහන් වගුවේ පරිදි නව පළාත් පාලන ආයතන ලෙස සංස්ථාපනය කරන ලදී.

| පළාත | දිස්ත්‍රික්කය | පැවති පළාත් සභා ආයතනය | නව පළාත් පාලන ආයතනය |
|---|---|---|---|
| මධ්‍යම | නුවරඑළිය | අඹගමුව ප්‍රාදේශීය සභාව. | මස්කෙළිය ප්‍රාදේශීය සභාව |
| | | | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| | | | අඹගමුව ප්‍රාදේශීය සභාව |
| | | නුවරඑළිය ප්‍රාදේශීය සභාව. | කොටගල ප්‍රාදේශීය සභාව |
| | | | ආගරපතන ප්‍රාදේශීය සභාව |
| | | | නුවරඑළිය ප්‍රාදේශීය සභාව |

පළාත් නවයක දිස්ත්‍රික්ක විසි තුනකට අදාළව ලැබුණු මෙවැනි යෝජනා හතළිස් හයක් සඳහා දිස්ත්‍රික් කමිටු නිර්දේශ ලැබී ඇති අතර, ඒ සම්බන්ධයෙන් 2019 මුල් මාස 03 ඇතුළත පළාත් මට්ටමෙන් සාකච්ඡා පවත්වා තීරණවලට එළඹීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.

## 05. පොදු රාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන සංසදයේ සම්මන්ත්‍රණය -2019

පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් අතර මෙන්ම ජාත්‍යන්තරය තුළ ද ශ්‍රී ලංකාවේ පළාත් පාලන ව්‍යුහය තුළ රජය සිදු කළ ප්‍රගතිශීලී වෙනස්කම් පිළිබඳව අවබෝධයක් ලබා දීමට අවස්ථා උදා කර ගැනීම සහ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ සිදුවන ගුණාත්මක වෙනස්කම් පිළිබඳව ද අන්තර්ජාතික වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමට අවකාශ ලබා ගැනීමේ අරමුණ පෙරදැරිව පොදු රාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන සංසදයේ "Citizen Centered Local Government - Driving Inclusive Social and Economic Change"යන තේමාව ඔස්සේ 2019 ජූනි මස 11-14 දක්වා වූ දිනයන්හී දී බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

එම සම්මන්ත්‍රණය මෙරටදී පැවැත්වීමට අදාළ නිල ප්‍රකාශයක් 2018 සැප්තැම්බර් 25 දින එවකට පළාත් සභා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාෆා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පොදුරාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන සංසදයේ ලේකම් ජෙනරාල් ආචාර්ය ග්‍රෙග් මුන්රෝ මහතා ඇතුළු දෙස් විදෙස් ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය.

## 06. අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ සම්බන්ධව කටයුතු කිරීම

2018 වර්ෂය තුළ පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පහත දිනයන්හීදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

| අනු අං: | අමාත්‍ය මණ්ඩල සංදේශය | අමාත්‍ය මණ්ඩල තීරණය |
|---|---|---|
| I. | නව පළාත් පාලන ආයතන සංස්ථාපනය හා පවත්නා පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම. | අමප/18/0424/744/011<br>2018 මාර්තු මස 27 |
| II. | අලුතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතනය සඳහා පහසුකම් සැලසීම. | අමප/18/1468/837/005<br>2018 ජූලි මස 25 |
| III. | සහෝදර නගර හෝ මිතුරු නගර සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ විදේශ රටවල පළාත් ආයතන අතර ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම. | අමප/18/2679/913/001<br>2018 නොවැම්බර් මස 21 |
| IV. | 2018 පළාත් පාලන මැතිවරණය මඟින් තේරී පත්වන සභිකයින්හට පහසුකම් සැලසීම. | අමප/18/0204/744/004<br>2018 පෙබරවාරි 14 |

## 07. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමුකරනු ලබන ගැටළු

### 7.1 පාර්ලිමේන්තු ප්‍රශ්න

පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙතින් පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ගැටළු අදාල පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර එම පළාත් වලින් ලබා ගන්නා නිරීක්ෂණ මත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. එලෙස 2018 වර්ෂය තුළ ඉදිරිපත් කරනු ලැබූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන 13කි.

2018 වර්ෂය තුළ පහත පළාත් වලින් පාර්ලිමේන්තු ප්‍රශ්න ඉදිරිපත් වී ඇත.

| පළාත | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 1 |
| වයඹ | 4 |
| උතුරු මැද | 3 |
| මධ්‍යම | 1 |
| සබරගමුව | 1 |
| පළාත් සියල්ලටම අදාළව | 3 |
| එකතුව | 13 |

### 7.2 මහජන පෙත්සම් කාරක සභාව

පළාත් පාලන ආයතන වෙතින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකිවන ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් මහජන පෙත්සම්කාරක සභාව මඟින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා පළාත් පාලන කොමසාරිස්වරුන්ගෙන් තොරතුරු ලබාගෙන එම පුද්ගලයන්ට සහන සැලසිය හැකි පරිදි මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි.

පළාත් පාලන ආයතනවල සේවය කරනු ලබන ඇතැම් නිළධාරීන් විසින් ආයතන මට්ටමින් නොවිසඳුනු පරිපාලන ගැටලු පෙත්සම් ලෙස මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන අවස්ථාද දැකිය හැකි වේ. එවැනි යොමු කිරීම් සඳහා විසඳුම් ලබා දීමටද අදාළ පළාත් පාලන කොමසාරිස්වරුන් වෙතින් තොරතුරු හා නිර්දේශ ලබාගෙන මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලැබේ. එලෙස 2018.12..31 දක්වා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම් ගණන 04කි.

| පළාත | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 2 |
| දකුණ | 2 |
| එකතුව | 4 |

## 08. මහජන පැමිණිලි විමර්ශනය කිරීම

ශ්‍රී ලංකාවේ පළාත් 09 තුල පිහිටි පළාත් පාලන ආයතන වලින් මහජනතාව වෙත සපයන සේවා සම්බන්ධයෙන් අතෘප්තියට පත් වුවහොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධව පැමි,ලි යොමු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ පළාත් පාලන අංශයට අනුයුක්තව පැමිණිලි විමර්ශන ඒකකයක් ස්ථාපිත කර ඇත. එලෙස යොමු කරනු ලබන මහජන පැමිණිලි සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියාකර විසදුම් ලබාදීම සඳහා අවස්ථානෝචිත පරිදි අදාල පළාත් ප්‍රධාන ලේකම් / පළාත් පාලන කොමසාරිස් / පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ.

2018 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා එලෙස යොමු කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව 669 කි.

| පළාත | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 262 |
| මධ්‍යම | 70 |
| දකුණ | 95 |
| උතුරු මැද | 40 |
| සබරගමුව | 46 |
| නැගෙනහිර | 41 |
| වයඹ | 60 |
| ඌව | 33 |
| උතුර | 22 |
| එකතුව | 669 |

## 09. සහෝදර නගර හෝ මිතුරු නගර සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ විදේශ රටවල පළාත් පාලන ආයතන අතර ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

ශ්‍රී ලංකාව නිදහස ලැබූ දා සිටම ''සහෝදර නගර හෝ මිතුරු නගර'' සංකල්පය යටතේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් විදේශ රටවල පළාත් පාලන ආයතන සමඟ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එහෙත් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2007 ජූලි මස 03 වන දින නිකුත් කරන ලද සහ 2011 ජනවාරි මස 14 වන දින නැවත නිකුත් කරන ලද අංක SP/CSA දරණ චක්‍රලේඛයේ සඳහන් උපදෙස් උල්ලංඝනය කරමින් සහ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් සංවේදිතා සහ / හෝ නෛතික අනුමැතිය පිළිබඳව මෙම අමාත්‍යාංශයේ හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ පූර්ව උපදේශකත්වයෙන් තොරව ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් විදේශ රටවල පළාත් පාලන ආයතන සමඟ ගිවිසුම්වලට සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම නිසා විදේශ රටවලින් ලබා ගන්නා ලද ඇතැම් ප්‍රදාන උපයෝජනය කළ නොහැකිව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් කර තිබේ.

එබැවින්, එවැනි ගැටළුකාරී තත්ත්වයන් වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් අංක **CP/2018/49** හා **2018.10.19** දිනැතිව ''සහෝදර නගර හෝ මිතුරු නගර සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ විදේශ රටවල පළාත් පාලන ආයතන අතර ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම'' මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ලදුව, 2018.11.21 වන දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එම අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමත වූ බව අංක අමප/18/2679/913/001 හා 2018.11.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී ඇත.

# 3.5. පළාත් සභා අංශය

## අරමුණ

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

## උපාය මාර්ග

1. ශ්‍රී ලංකාවේ සමස්ත සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි සුරක්ෂිත බව උදෙසා එක් එක් පළාතෙහි පවත්නා මානව සම්පතෙහි උපයෝගීතාවය වඩාත් තහවුරු කිරීම.
2. යහ පාලන මූලධර්ම මත පිහිටා එක් එක් පළාත තුළ පවත්නා මානව ප්‍රාග්ධනය සහ පාරිසරික සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් පළාත් ආදායම් ප්‍රභවයන් වඩාත් ශක්තිමත් කිරීම.
3. බාහිර සංක්‍රමණ අනුපාතය සාපේක්ෂව වඩා ඉහළ මට්ටමක පවත්නා පළාත් සභාවන්හි එකී අනුපාතය අවම කිරීමට සුදුසු ප්‍රතිපත්ති හා දිගු කාලීන වැඩසටහන් හඳුන්වාදීම.

## 2018 වසරේ 4 වන කාර්තුව අවසානයේ පළාත් සභා අංශයේ ප්‍රගතිය

**01. උතුරු පළාතේ ක්‍රියාත්මක කරනු ලබන අම්මච්චි වැඩසටහන. (අයවැය යෝජනා)**

2018 අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක අම්මච්චි වැඩසටහන යටතේ උතුරු පළාතේ සම්ප්‍රදායික හා පෝෂ්‍යදායි ආහාර නිෂ්පාදනය කිරීමේ හා අළෙවි කිරීමේ මධ්‍යස්ථාන පහක් (5) ඉදිකිරිම සඳහා රු. 5781079.39 ක මුදලක් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත ලබා දි ඇත.

**02. අන්තර් පළාත් විෂය සම්බන්ධිකරණ සමුළුව.**

පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ අදාළ ආයතනවල නියෝජිතයන්ගේ රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.

**03. පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.**

පළාත් වලින් තොරතුරු ලබාගෙන තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලින කර ඇත.

**04. ඉඩම් අත්පත් කරගැනීම. (පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා)**

ඉඩම් අත්කර ගැනිමට අදාළව සියළුම පළාත් වෙතින් ඉල්ලීම් 383ක් මෙම අමාත්‍යාංශය වෙත ප්‍රධාන ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව යොමු කර ඇති අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරි කටයුතු සඳහා ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අඩුපාඩු සහිතව යොමුකර ඇති අයදුම්පත් අඩුපාඩු සකස්කර යොමුකරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දි ඇත.

1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ 2 වගන්තියේ නියමය නිකුත් කිරිමේ සිට ඉදිරි කටයුතු සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත්කර තිබූ ඉල්ලිම් 125ක් ඇතුළු ලිපි ලේඛන සමඟ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කිරීමද, 04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 12 දෙනෙකු පත් කිරිමද, 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාළව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට නිර්දේශ 08ක් ඉදිරිපත් කිරිමද, 39(අ)1 වගන්තිය යටතේ ඉඩම් අවසතු කිරිම් 3ක් හා 50(1) වගන්තිය යටතේ ඉඩම් අත්හැරීම් 7ක් මෙම අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ නිර්දේශය සහිතව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත යොමු කිරීමද සිදුකර ඇත.

**05. පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වාහන බලපත්‍ර නිකුත් කිරීම.**

උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා වෙත තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා 01/2017 චක්‍ර ලේඛය සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල සටහනක් ද , උතුරු පළාත් පළාත් සභා මන්ත්‍රිවරුන් වෙත වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා 01/2017 චක්‍ර ලේඛය සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල සටහනක් ද ඉදිරිපත් කර ඇත.

**06. සේවා ව්‍යවස්ථා සකස් කිරීම හා පළාත් රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීමේ නිර්ණායක.**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරින් (සිවිල්/විදුලි/යාන්ත්‍රික) සඳහා වෙනම සේවයක් ස්ථාපිත කිරීමට රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය මගින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ සේවා ව්‍යවස්ථා කෙටුම්පත පළාත්වල නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම සඳහා සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කර ඇත. දකුණ, සබරගමුව, උතුර යන පළාත්වලින් නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, මධ්‍යම හා වයඹ යන පළාත්වල නිර්දේශ පසුව ලබා දෙන බව දන්වා ඇත.

**07. පළාත් පාලන කළමනාකරණ සේවා තනතුරු ස්ථාපිත කිරීම.**

පළාත් පාලන කළමනාකරණ සේවා තනතුරු ඇති කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා රාජ්‍ය පරිපාලන, කලමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

**08. 03/2014 චක්‍ර ලේඛය අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම.**

පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා නව තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 03/2014 පරිදි ලැබී ඇති ඉල්ලීම් 467ක් නිර්දේශ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

**09. පළාත් සභා අවශ්‍යතා අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.**

පළාත් සභාවන්ට අදාල ගැටළු පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ 06ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

**10. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම.**

ලද අයදුම්පත් 83ක් නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

**11. දේශපාලන හේතූන් මත විවිධ ගැටළු වලට මුහුණදුන් අයට සහන සැලසීම.**

2017.03.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරින් 168කගේ අභියාචනා පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත ලැබුණු අතර, එයින් 115කගේ තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා අදාළ පළාත් ප්‍රධාන ලේකම්වරුන්වෙත යොමුකරන ලදි. එයින් 57ක ප්‍රගතිය මෙම අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. එසේම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පසු විපරම් කටයුතු ද සිදුකරනු ලබයි.

**12. පළාත් සභා ධූරධාරීන්ගේ වරප්‍රසාද දීමනා හා පහසුකම්.**

පළාත් සභා ධූරධාරින්ගේ වරප්‍රසාද සම්බන්ධව පොදු ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් චක්‍ර ලේඛ කෙටුම්පතක් සකස් කර එය අනුමත කරගැනීම සඳහා 2018.01.05 දින ගරු අමාත්‍යතුමාගේ අත්සනින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඇති අතර, එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2018.01.30 දින එළඹි තීරණ ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල සංශෝධන සහිතව අනුමැතිය ලැබුණු අතර, එකී සංශෝධන ද ඇතුලත් කරමින් සකස් කරන ලද කෙටුම්පත් චක්‍ර ලේඛය 2018.02.08 දිනැතිව ජනාධිපති ලේකම් වෙත යොමුකර ඇත.

**13. මහජන පෙත්සම් කාරක සභාව.**

පෙත්සම් 02ක් අවශ්‍ය කටයුතු සඳහා අදාල පළාත් සභා වෙත යොමු කර ඇති අතර මහජන පෙත්සම් කාරක සභාව විසින් එවා ඇති මහජන පෙත්සම්වලට අදාළ වාර්තා 01ක් සම්බන්ධව මෙම අමාත්‍යාංශයේ නිර්දේශය මහජන පෙත්සම් කාරක සභාවට යොමු කර ඇත.

**14. පාර්ලිමේන්තු ප්‍රශ්න.**

පාර්ලිමේන්තු ප්‍රශ්න 38ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුවට යොමු කර ඇත.

**15. ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ සංවර්ධන වැඩසටහන්.**

i. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 1,264,989.00ක මුදලක් ගෙවීම් කර ඇත.

II. කඩිනම් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ මධ්‍යම පළාත සඳහා රු. 1,358,700.00 ක් ද, දකුණු පළාත සඳහා රු. 375,000.00ක් ද, සබරගමුව පළාත සඳහා රු. 418,000.00ක් ද, නැගෙනහිර පළාත සඳහා රු. 1,778,291.60ක් ද, උතුරු පළාත සඳහා රු. 1,050,000.00ක් ද වශයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත මුදල් ගෙවීම් කර ඇත.

iii. තිරසර පාසල් සමාජීය සංවර්ධන වැඩසටහන යටතේ වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 5,031,923.52ක මුදලක් ගෙවීම් කර ඇත.

vi. දරුවන් සුරකිමු ජාතික වැඩසටහන යටතේ බස්නාහිර පළාත සඳහා රු. 432,000.00ක් ද, දකුණු පළාත සඳහා රු. 2,290,890.42ක් ද, මධ්‍යම පළාත සඳහා රු. 793,622.70ක් ද වශයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත මුදල් ගෙවා ඇත.

v. පඬුවස්නුවර අංක 8 වාරිමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 11,314,519.03ක මුදලක් ගෙවීම් කර ඇත.

vi. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 154,925.00ක මුදලක් ගෙවීම් කර ඇත.

vii. වයඹ පළාත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 19,569,243.46ක මුදලක් ගෙවීම් කර ඇත.

16. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විශේෂ වැඩසටහනක් වන පුබුදමු පොලොන්නරුව වැඩසටහන යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් වෙත රු. 173,495,311.43 ක මුදලක් ගෙවීම් කර ඇත.

# 3.6. නීති අංශය

1. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා අණපනත් සංශෝධන යෝජනාවලියක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව මඟින් පනත් සංශෝධනයට අදාළව සකස් කරන ලද යෝජනාවලිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත නීති කෙටුම්පත් සම්පාදනය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලදී. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකසන ලද අවසන් කෙටුම්පත් නීතිපති සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

2. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ සංශෝධන සියල්ල කැටිකොට පරිශීලනය පහසුව සඳහා එක් පනතක් වන ආකාරයෙන් සකසා ඇත. එය ඉදිරියේ අමාත්‍යාංශ වෙබ් අඩවියට ඇතුලත් කිරීමට නියමිතය.

3. 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් සංශෝධන පනතේ තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමේ යෝජනාවලිය සකස් කිරීමේ කටයුතු මේවන විට අවසන් කර ඇත. නීති කෙටුම්පත්කරණය සඳහා උපදෙස් ලබා දීමට එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

4. වතු කම්කරුවන්ගේ සුභසාධනය සැලසීම සඳහා ප්‍රතිපාදන සැලසීමට හැකිවනසේ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම පිණිස සකස් කරන ලද පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත විය.

5. පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සහ පළාත් සභා ප්‍රඥප්ති සම්පාදන උපදෙස් සංග්‍රහය මුද්‍රණය කොට ප්‍රසිද්ධියට පත් කර ඇත.

6. අත්‍යාවශ්‍ය විෂයන්ට අදාළව පළාත් සභා සඳහා ආදර්ශ ප්‍රඥප්ති සකස් කිරීමේ වැඩසටහන.

7. මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන වලට සෘජුවම ලබාදීම සම්බන්ධ පනත් කෙටුම්පතක් සකස් කොට නීතිපති සහතිකය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

# 3.7. පාලන අංශය

අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය හා භෞතික සම්පත් කළමනාකරණය පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. පහත ක්‍රියාකාරකම් මඟින් එකී කාර්යභාරය 2018 වර්ෂය අවසානයේ සාධනීය මට්ටමින් ඉටු කර ඇත.

| | කාර්යය | ඉටු කළ මූලික ක්‍රියාකාරකම් |
|---|---|---|
| **01.** | මානව සම්පත් කළමනාකරණය | පෞද්ගලික ලිපිගොණු පවත්වාගෙන යාම |
| | | නිවාඩු ලේඛණ පවත්වාගෙන යාම |
| | | දෛනික තැපැල සම්බන්ධ සියලුම කටයුතු සිදු කිරීම |
| | | අභ්‍යන්තර හා බාහිර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම |
| | | නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ කටයුතු සිදු කිරීම |
| | | තනතුරු යටපත් කිරීම් හා නව තනතුරු ඇති කිරීම |
| | | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම |
| **02.** | පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණය | අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම |
| | | මෙම අමාත්‍යාංශයට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීම |
| | | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම. |
| **03.** | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| | | එක් එක් අංශ මඟින් වෙබ් අඩවියේ පල කළ යුතු තොරතුරු රැස් කිරීම |
| | | තොරතුරු ඉල්ලා සිටින පාර්ශවයන් වෙත පනතේ විධිවිධාන අනුව තොරතුරු ලබා දීම |
| **04.** | දෛනික තැපැල පවත්වාගෙන යාම | සාමාන්‍ය තැපැල, ලියාපදිංචි තැපැල, සීඝ්‍රගාමී තැපැල, අතින් ලිපි භාර දීම ඇතුළු තැපැල සම්බන්ධ සියලුම රාජකාරි කටයුතු සිදු කිරීම |
| **05.** | ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම | " ඵලදායිතා " ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම |
| | | 5S සංකල්පය ක්‍රියාත්මක වන සම්මාන ලත් ආයතන වල නිරීක්ෂණ චාරිකා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සහභාගි කරවීම |
| | | 5S සංකල්පය එක් එක් අංශ මඟින් ක්‍රියාත්මක කරවීම |
| | | ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය යටතේ අමාත්‍යාංශ පරිශ්‍රය තුළ වගා කටයුතු සිදු කිරීම හා හරිත පැහැ ගැන්වීම |
| | | අමාත්‍යාංශ පරිශ්‍රය අලංකාර කිරීම සඳහා විසිතුරු මල් පැල සිටුවීම |

| | | |
|---|---|---|
| **06.** | **භෞතික සම්පත් කළමනාකරණය** | 1. රාජ්‍ය අමාත්‍ය කාර්යාලය, අමාත්‍යාංශ නිලධාරීන්ගේ කාර්යාල පරිශ්‍ර නවීකරණය කිරීම හා අමාත්‍යාංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>2. බාහිර සේවා සපයන ආයතන සමඟ සම්බන්ධ වී අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම. |

## ඵලදායිතා වැඩසටහන තුළ ඇති වූ සාධනීය වෙනස්කම්

පළාත් සභා හා පළාත් පාලන අංශය රාජ්‍ය අංශයේ සේවා සපයන ඵලදායී ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් යුතුව නව තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ වඩාත් ප්‍රශස්ථ වූ ස්ථරයක් වෙත විතැන් කරවීම සඳහා ඵලදායිතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමඟ 2018 වර්ෂයේදී අවබෝධතා ගිවිසුමකට එළඹී ඇත.

ඒ අනුව, මේ වන විට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අනුග්‍රහයෙන් ඵලදායිතාවය පිළිබඳ දේශන හා වැඩමුළු පවත්වා ඇත. එමඟින් ඵලදායිතාවය පිළිබඳ අවබෝධය හා ඉන් ලැබී ඇති ඵල ප්‍රයෝජන පිළිබඳව නිලධාරීන් දැනුම්වත් වීම නිසාවෙන් ඵලදායිතාවය පිළිබඳ ධනාත්මක ආකල්පයක් හා ඵලදායී එළඹුමක් නිලධාරීන් තුළ වර්ධනය වී ඇත.

පංචවිධ සංකල්පය ක්‍රියාත්මක කිරීම තුළින් සුපිළිවෙළවත් වූ වැඩ පරිසරයක් නිර්මාණය වීම හා එමඟින් ප්‍රියජනක වැඩ පරිසරයක් පවත්වා ගෙන යාමට නිලධාරීන් පෙළඹී තිබීම යන සාධනීය වෙනස්කම් මේ වන විට සිදු වෙමින් පවතී.

එසේම ඵලදායිතා වැඩසටහන් වලින් සාර්ථකත්වය ලද ආයතනවල ක්ෂේත්‍ර චාරිකා ඔස්සේ සිදු කරන නිරීක්ෂණයන් තුළින් නව අදහස් හා නිර්මාණාත්මක ප්‍රවේශයන් වෙත නිලධාරීන් යොමු වීමත් ඵලදායිතා කව නිර්මාණය කිරීම තුළින් නව ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමද ඵලදායිතා ප්‍රවේශයන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා පියවර ගැනීමද මීට අදාළ ඉදිරි සැලසුම් ලෙස දැක්විය හැක.

# 3.8. මූල්‍ය අංශය

## මෙහෙවර

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදීම, දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව යොදාගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම.

## කාර්යයභාරය

1. **මූල්‍ය සම්පත් කළමනාකරණය**

   අමාත්‍යාංශයේ අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම පදනම් කරගෙන සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්මට අනුව අවශ්‍ය අරමුදල් ඇස්තමේන්තු සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර මුදල් වෙන් කරවා ගැනීම. එම මුදල් ඒ ඒ කාර්යයන් සඳහා නියමිත පරිදි යොදාගත් බවට තහවුරු කර ගනිමින් අප්‍රමාදයකින් තොරව ගෙවීම් කටයුතු ඉටු කිරීම.

2. **භෞතික සම්පත් කළමනාරකණය**

   ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව භාණ්ඩ හා සේවා නියමිත ප්‍රතිපාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අවශ්‍ය පරිදි සපයාදීම. ඒවා නඩත්තු කිරීම, ගිණුම්ගත කිරීම හා අදාළ වත්කම් ලේඛණ පවත්වාගෙනයාම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීම තුළින් නිවැරදිභාවය තහවුරු කිරීම.

3. **ගිණුම් පොත්පත් හා වාර්තාකරණය**

   සියලුම ගනුදෙනුවලට අදාළ ගිණුම් වාර්තා පොත්පත් හා ලේඛණ පවත්වාගෙනයාම හා මාසික, කාර්තුමය හා වාර්ෂික වාර්තා අදාළ ආයතනවලට නියමිත පරිදි නියමිත දිනයන්හි ලබාදීම හා ඉහළ කළමනාකරණයට අවශ්‍ය කාලීන තොරතුරු ලබාදීම තුලින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාරී වීම.

4. **අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම**

   පාර්ලිමේන්තුවෙන් වෙන්කර ඇති මුදල් වියදම් වූ ආකාරය පිළිබඳව අවසන් ගිණුම් එනම්, වාර්ෂික විසර්ජන ගිණුම හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ගෙනයාමට ඉදිරිපත් කිරිම තුළින් මුදල් පිළිබඳ වගකීම හා වගවීම යන කරුණු තහවුරු කිරීම.

## සපුරාගත් ඉලක්ක

1. විසර්ජන පනත මඟින් වෙන්කරනු ලැබූ මුදල් හා විදේශ ව්‍යාපෘති යටතේ වෙන්කරන ලද මුදල් එම වෙන්කරන ලද කාර්යයන් සඳහාම යොදවා ගනිමින් ද එසේ වෙන්කරන ලද මුදලේ අතිරික්තයක් වේ නම් වෙනත් අවශ්‍ය කාර්යයක් සඳහා මාරුකිරීම තුළින් සියළුම මුදල් අරපිරිමැස්මෙන් වියදම් කර ඒ පිළිබඳ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අවසාන ගිණුම (විසර්ජන ගිණුම) නියමිත දිනට ඉදිරිපත් කරතිබීම.
2. අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක සපුරාගැනීම පිණිස අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමාදයකින් තොරව ලබාදීම හා අමාත්‍යාංශයේ වත්කම් නිසිපරිදි කළමනාකරණය කර තිබීම.
3. දේශීය සහ විදේශීය ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂික වශයෙන් භාණ්ඩාගාරයට නිසි වේලාවට ඉදිරිපත් කර කලට වේලාවට අරමුදල් ලබාගෙන තිබීම.

4. අත්තිකාරම් බී ගිණුම යටතේ වෙන්වෙන ප්‍රතිපාදන මඟින් රජයේ නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ණය මුදල් ලබාදීමට කටයුතු කර තිබිම.

5. අමාත්‍යාංශයට අවශ්‍ය භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීමේදී මෙන්ම පළාත් පාලන බල ප්‍රදේශවල සංවර්ධන හා යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් හා කාර්යක්ෂමව ඉටු කර තිබීම.

6. විගණකාධිපතිගේ විගණන විමසුම්වලට සහ අභ්‍යන්තරික වශයෙන් පැන නැගුණ විගණන විමසුම්වලට අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීම හා අනාවරණය කෙරෙන අඩුපාඩු නිවැරදි කරගැනීමට අප්‍රමාදව කටයුතු කර තිබීම සහ රාජ්‍ය ගිණුම්කාරක සභා අවස්ථාවට අවශ්‍ය අවස්ථාවන්හි දී පෙනී සිටීම.

7. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු සහ සේවාවන් සඳහා අප්‍රමාදව මුදල් නිදහස් කර තිබීම.

## 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කාර්යයන්

1 වැල්ලවත්ත පොම්පාගාරය අළුත්වැඩියාකිරිම ඇතුළුව ද්විතියික අපජල පිරිපහදු මධ්‍යස්ථානය

2 කි.මී. 125 ක්වන මළාපවාහන මාර්ගයන්හි පිරිසිදුකිරීම්, CCTV පරීක්ෂණ සහ වත්කම් සංචිතයක් සැකසීම.

3 කොළඹ දකුණ ධාරක ප්‍රදේශයහි කි.මී.15.61 වන මළාපවාහන ජාලය, පුනරුත්තාපනය, ප්‍රතිස්ථාපනය, අළුත්වැඩියාකිරිම සහ පිරිසිදුකිරීම මඟින් මළ නලයන්හි හානි වීම්, හිරවීම් සහ රොන්මඩ ගැටළු විසඳීම සහ ධාරිතාවය සහ නැවත සකස්කිරීමේ අවශතා සම්පූර්ණ කිරීම.

4 කොළඹ දකුණු ධාරක ප්‍රදේශයහි සේවා නොලබන තවත් ප්‍රදේශ දෙකක් ආවරණය කිරීම සඳහා කි.මී. 6.22 මළාපවාහන ජාලයක් ස්ථාපිත කිරීම හා පොම්ගාර තුනක් ස්ථාපනය කිරීම.

5 ශ්‍රී ලංකායේ දැනට පවතින සම්ප්‍රදායික වීදි පහන් වෙනුවට වැඩිදියුණු කල එල්ඊඩී විදුලි පහන් සවිකිරීමේ ව්‍යාපෘතිය.

6 නෙදර්ලන්ත සහන මූලය ණය ක්‍රමය යටතේ ග්‍රාමීය පාලම් ඉදිකිරීම.

7 නැඟී එන ප්‍රදේශයන්හි ග්‍රාමීය යටිතල පහසුකම් දියුණුකිරීම සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය - පානීය ජල සම්පාදනය.

8 නැඟී එන ප්‍රදේශයන්හි ග්‍රාමීය යටිතල පහසුකම් දියුණුකිරීම සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය - ග්‍රාමීය මාර්ග.

9 කොළඹ මහනගර සභාව සඳහා ඔස්ට්‍රියානු සහන ණය ක්‍රමය යටයත් "ඒ" ශ්‍රේණියේ ගිනි නිවීම් මධ්‍යස්ථාන 3ක් සැපයීම.

10 ග්‍රාමීය පාලම් ඉදිකිරීම - ඔස්ට්‍රියාව

11 ග්‍රාමීය පාලම් ඉදිකිරීම - බෙල්ජියම

12 ග්‍රාමීය පාලම් ඉදිකිරීම - හංගේරියාව

13 ග්‍රාමීය පාලම් ඉදිකිරීම - මහා බ්‍රිතාන්‍ය

14 ද්විතියික නගර ධරණීය සංවර්ධන ව්‍යාපෘතිය.

15 කසළ රැස්කිරීමේ උපකරණ (කොරියන් එක්සිම් බැංකු) ණය අංක 29 30).

16 පුරනැගුම ව්‍යාපෘතියේ ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ බතලයාය, බෙල්ලන්ගවිල ප්‍රදේශයන්හි ව්‍යාප්ත ජාල සැකසීම සහ නළ එලීම.

17 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ගිරාඳුරුකෝට්ටේ පිරිපහදු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සිවිල් කටයුතු සහ ජල සැපයුම් යෝජනා ක්‍රමය.

18 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ගිරාඳුරුකෝට්ටේ පිරිපහදු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම යාන්ත්‍රික සහ විද්‍යුත් කටයුතු සහ ජල සැපයුම.


19 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ දඹුල්ල ග්‍රාමීය ප්‍රදේශයන්හි සහ කණ්ඩලම ජල සැපයුම් දීර්ඝකිරීම.


20 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉණාමලුව සහ කිතුල්හිටියාව ජල සැපයුම් දීර්ඝකිරීම.

21 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සීගිරිය සහ හබරණ ජල සැපයුම් දීර්ඝකිරීම.

22 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ගලේවෙල සහ තිත්තවැල්ගොල්ල ග්‍රාමීය ප්‍රදේශයන්හි සහ කණ්ඩලම ජල සැපයුම් දීර්ඝකිරීම.

23 ජපානයේ සයිනෙට් කෝපරේෂන් මඟින් ණය ප්‍රදාන යටතේ උපකරණ සහ උපාංග ලබාගැනීම.





| | | | |
|---|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | 20.2 | 14.850061 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | 7 | 5.824842 |
| විදේශීය ආධාර ලබන ව්‍යාපෘති | A | 11,517.45 | 9,972.88 |
| දේශීය ආධාර ලබන ව්‍යාපෘති | B | 4,622.95 | 3,561.84 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | C | 659.80 | 604.92 |

# 3.9. වියදම් විමංසන අංශය

**අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
**මූල්‍ය ප්‍රගති වාර්තාව-2018**

**ප්‍රාග්ධන වියදම්**


| විස්තරය | |
|---|---|
| අමාත්‍යාංශය | A |
| විදේශ ආධාර ව්‍යාපෘති | B |



## අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## මූල්‍ය ප්‍රගති වාර්තාව - 2018

### පුනරාවර්තන වියදම්

| විස්තරය | |
|---|---|
| පුද්ගල පඩි නඩි | A |
| වෙනත් | B |



1. පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කිරීම විමංසන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යය සඳහා මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානය, පළාත් සභා ඇස්තමේන්තු, සත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු උපයෝගී කරගනු ලබයි. මෙම තොරතුරු විමංසනය තුළින් මතුවන විචල්‍යතා හා ගැටළු පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට ලක්කිරීමට කටයුතු කරන අතර එමඟින් තම මූල්‍ය කටයුතුවල අපේක්ෂිත ඉලක්කයන් කරා පළාත් සභා යොමු කරවීම අරමුණු කෙරේ.

02. ඒ අනුව 2018 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යනු ලබන අතර, පළාත් සභා මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් මාසික හා කාර්තු පදනමින් වාර්තා සකස් කරනු ලැබේ. මෙම කාර්තු වාර්තා සියලුම පළාත් සභාවන් හා මහා භාණ්ඩාගාරය වෙතත් ජන සංඛ්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඔවුන්ගේ කාලීන වාර්තා වල පළ කිරීම සඳහාත් එසේම මෙම තොරතුරු අපේක්ෂිත අනෙකුත් ආයතන වෙතත් නිකුත් කරනු ලබයි. මෙම කාර්යය 2019 වසරේ දී ද අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.

03. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2018 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇති අතර 2019 වර්ෂයේ දී ද මෙම කාර්යය අඛණ්ඩව කර ගෙන යාමට සැලසුම් කර ඇත.

04. පළාත් පාලන ආයතනයන්හි ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම මෙම වර්ෂයේ දී 2017 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ වාර්තාවක් සකස් කර සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. 2019 වර්ෂය තුළදී 2018 වර්ෂයට අදාළ පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට සැලසුම් කර ඇත.

05. මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර මෙම කාර්යය 2019 වසරේදී ද අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.

06. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මගින් 2018 වර්ෂයේ දී කාර්තුමය වශයෙන් තොරතුරු පළාත් සභා වෙතින් ගෙන්වා ගනු ලැබේ. එම තොරතුරු උපයෝගී කර ගනිමින් අදාළ කාර්යයන්හී ප්‍රගතිය විමසා බලන අතර, එම කටයුතු සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදයන් හෝ ගැටළු සහගත තත්ත්වයන් පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට යොමු කර ඇත. 2019 වර්ෂයේ දී ද මෙම කාර්යය අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.

07. රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව පළාත් පාලන ආයතන වෙත නව ගිණුම් ක්‍රමයක් හඳුන්වාදීම ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) මගින් සිදු කර ඇත. මෙම ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ පළාත් සභා, පළාත් පාලන ආයතන සහ අනෙකුත් පාර්ශව සම්බන්ධීකරනය මෙම අංශය මගින් සිදු කරයි. මේ වන විට මෙම ගිණුම් ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර පුහුණු කරුවන් පුහුණු කිරීමේ කටයුතු මේ වන විට අවසන් වී ඇත. 2019 වසරේදී ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

# 3.10. අභ්‍යන්තර විගණන අංශය

01. කළමනාකරණ විගණන ඩිඑම්ජ්/2009(1) හා 2009.06.09 දිනැති චක්‍රලේඛයෙහි ඇමුණුම 03 පරිදි අමාත්‍යාංශයේ මූලික වාර්තාව සකස් කර 2018.01.29 වන දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

02. කළමනාකරණ විගණන ඩිඑම්ජ්/2009(1) හා 2009.06.09 දිනැති චක්‍රලේඛයෙහි 07 පරිච්ඡේදයේ ඇමුණුම 02 පරිදි අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැළැස්ම සකස් කර 2018.01.25 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

03. 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත.

04. 2018.09.13 වන දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති වාහන අලාභ කපා හැරීමේ කමිටුවේදී මු.රේ. 104 පරීක්ෂණ අවසන් කර ඇති වාහන දෙකක අලාභ කපා හැරීමට තීරණය කර ඇත.

05. 2018 වර්ෂය තුළ පහත පරිදි විශේෂ විමර්ශන 06ක් සිදු කර ඇත.

**5.1 සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව සිදු කළ විමර්ශන**

| **විමර්ශනය සිදු කළ ව්‍යාපෘතිය** | **දිනය** |
|---|---|
| ▪ දැයට කිරුළ 2013 දමන ප්‍රාදේශීය සභාවේ සංචාරක නිවාසය ඉදිකිරීම | 2018.02.16 |
| ▪ අක්කරෙයිපත්තු නගර සංවර්ධනය යටතේ පොදු වෙළඳපොළ ඉදිකිරීම - II කොටස | 2018.03.09 |
| ▪ දැයට කිරුළ සංවර්ධන වැඩසටහන 2013 යටතේ පෝරතීවුපත්තු ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 2018.02.19 |
| ▪ පඩුවස්නුවර නගර සංවර්ධනය යටතේ හෙට්ටිපොළ නගරයේ පදික වේදිකාව හා කාණු පද්ධතිය ඉදිකිරීම | 2018.02.16 |

**5.2 අනෙකුත් කටයුතු වලට අදාළව සිදු කළ විමර්ශන**

| **සිදු කළ විමර්ශනය** | **දිනය** |
|---|---|
| • කෘත්‍රිම ධාවන පථය හා ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ලද පරිත්‍යාග සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව මූලික විමර්ශනයක් සිදුකිරීම | 2018.12.31 |
| • පුරනැගුම ව්‍යාපෘතියේ දකුණු පළාත් කණ්ඩායම් නායක ඉවත්කිරීම පිළබඳ විමර්ශනයක් සිදු කිරීම | 2018.12.31 |

06. රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පළාත් පාලන ආයතන අයත් පළාත්වල ප්‍රධාන ලේකම්වරු වෙත දැනුම් දී ඇත.

07. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්ය සාධනය පිළිබඳ ඇගයීම සඳහා සකස් කර ඇති පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය 2 වන අදියර යටතේ 2017/2018 වර්ෂවල ඇගයීම් සඳහා යොදා ගන්නා නිර්ණායක පුළුල් කිරීම සම්බන්ධයෙන් 2018.03.15 දින පාර්ලිමේන්තුවේ පැවති රැස්වීමට සහභාගීවීම හා පළාත් පාලන ආයතන හා පළාත් සභාවලට අදාළ ඇගයීම් නිර්ණායක සකස් කර ඉදිරිපත් කිරීම.

08. ගලෙන් බිඳුණු වැව ප්‍රාදේශීය සභාවේ සහ ත්‍රිකුණාමල නගර සභාවේ පැවැත්වීමට නියමිතව තිබූ ගිණුම් කාරක සභා රැස්වීම් සඳහා අදාළ වාර්තා ගිණුම් කාරක සභාවේ ලේකම් වෙත යොමු කිරීම.

09. 2018 වර්ෂය තුළ අධිභාර කටයුතු සම්බන්ධයෙන් 2018.10.23 වන දින VII වන අධිභාර අභියාචනා කමිටු රැස්වීම පැවැත්වීම

10. 2018 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලද විගණන පරීක්ෂණ වාර්තා 27 ක් ඉදිරිපත් කර ඇත.

11. අමාත්‍යාංශයේ හා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, දේශීය ණය සහ සංවර්ධන අරමුදල හා ව්‍යාපෘතිවල බැංකු සැසදුම් විගණනය සිදු කර ඇත.

12. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහනඃ

2016 වර්ෂයට අදාළව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා වාර්තා වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කිරීම සඳහා සියළුම පළාත් පාලන ආයතන වල ප්‍රගතිය ඇතුළත් අදාළ වාර්තාව භාෂාත්‍රයෙන් සැකසීම.

# 3.11. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

## හැඳින්වීම

- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කර ඇත.
- මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් පත්වන සාමාජිකයන් 8 දෙනෙකු සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකු ඇතුලත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබේ.
- මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදු කරනු ලැබේ.

## පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යභාරය

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන් හි සහභාගීත්වය ඇතිව පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩි දියුණු කරලීම සඳහා පුහුණු කිරීම්, උපදේශන සේවා හා පර්යේෂණ දියත් කිරීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලූ පාර්ශවකරුවන්ට තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අදාල ජාතික හා අන්තර් ජාතික ආයතන සමඟ සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනවලට අදාල දත්ත හා තොරතුරු එක් රැස් කිරීම සහ එම තොරතුරු පවත්වා ගෙන යාම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමඟ අන්තර් සබඳතා ගොඩ නඟාගනිමින් පළාත් පාලනය පෝෂණය කිරීම.

  මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ආයතනය, පහත සඳහන් වැඩසටහන් දියත් කරනු ලබයි.

  ජාතික / ප්‍රාදේශීය මට්ටමේ පුහුණු වැඩමුළු අන්තර් ජාතික / ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ ප්‍රායෝගික සැසි.

## ඩිප්ලෝමා පාඨමාලා

පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව /පළාත් පාලනඩිප්ලෝමා පාඨමාලාව/මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව /පළාත් පාලන ඉංජිනේරු ඩිප්ලෝමාව/ ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

## සහතික පත්‍ර පාඨමාලා

පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව/ පරිගණක සහතික පත්‍ර පාඨමාලාව/ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව/ දේශපාලන ප්‍රවේශය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

පර්යේෂණ/ උපදේශණ සේවා සැපයීම
අත්පොත්, අත්පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් ත්‍රෛමාසික ව පළාත් පාලන පුවත් ඇතුළත් පුවත් පත් සඟරා ප්‍රකාශයට පත්කිරීම. පළාත් පාලන පුවත්පත (සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන්) ප්‍රකාශයට පත් කෙරේ. එමෙන්ම පළාත් පාලනය පිළිබඳ වාර්ෂික සඟරාවක්ද පළකෙරේ.

ඉහත කාර්යයන් සිදුකිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පහත සඳහන් අංශ වලින් සමන්විත වී ඇත.

- ඉංජිනේරු අංශය
- පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
- මූල්‍ය කළමනාකරණ අංශය
- භෞතික සැලසුම් අංශය
- නීති අංශය
- පර්යේෂණ අංශය
- පරිගණක අංශය
- පුහුණු අංශය
- ආයතනික ධාරිතා සංවර්ධන අංශය

## 1. 2018 වර්ෂය

### මානව සම්පත් සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

### ඉංජිනේරු අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| **01** | පළාත් පාලන ආයතනවල තාක්ෂණ නිලධාරීන් සඳහා දැනුම හා කුසලතා සංවර්ධන වැඩසටහන (ඇලුමිනියම්, ජලනල හා තාක්ෂණික විෂයන් යටතේ) | **09** | **09** | **400** |
| **02** | පළාත් පාලන ආයතනවල තාක්ෂණ නිලධාරීන් සඳහා වාහන හා යන්ත්‍රෝපකරණ කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීම තුළින් නඩත්තු වියදම් අඩු කර ගැනීම | **09** | **09** | **420** |
| **03** | පළාත් පාලන ආයතනවල තාක්ෂණ නිලධාරීන් සඳහා මාර්ග ඉදිකිරීම් සහ පාංශු පරීක්ෂා කිරීම සම්බන්ධ පරීක්ෂණ සඳහා දැනුම හා නිපුණතා සංවර්ධන වැඩසටහන | **09** | **09** | **450** |

## පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව පිළිබඳ පුහුණුව | 09 | 06 | 325 |
| 02 | පෞද්ගලික ලිපිගොනු සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | 09 | 08 | 336 |
| 03 | සතුටින් වැඩ කිරීම පිළිබඳ වැඩමුළුව | 09 | 05 | 265 |

## භෞතික සැලසුම් අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් සඳහා භූමි අලංකරණය පිළිබඳ වැඩමුළුව | 09 | 09 | 427 |
| 02 | පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 04 | 04 | 240 |
| 03 | පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 05 | 05 | 194 |
| 04 | පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් සඳහා ස්වාධිපත්‍ය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 03 | 03 | 113 |
| 05 | පළාත් පාලන ආයතනවල අදාල නිලධාරීන් සඳහා දේපල තක්සේරුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 06 | 06 | 518 |

## නීති අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් සඳහා ගිවිසුම් ක්‍රමවිධි හා දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ පුහුණු වැඩමුළුව | 09 | 09 | 414 |
| 02 | පළාත් පාලන ආයතනවල අදාල නිලධාරීන් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 09 | 09 | 395 |
| 03 | පළාත් පාලන ආයතනවල අදාල නිලධාරීන් සඳහා පළාත් පාලන නීතිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 09 | 09 | 478 |
| 04 | පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | 01 | 30 |

## පර්යේෂණ අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනවල ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය | 01 | කෙටුම්පත් වාර්ථාව අධ්‍යයනය කරමින් පවතී. |
| 02 | පළාත් සභා විසින් සැළසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය | 01 | කෙටුම්පත් වාර්ථාව අධ්‍යයනය කරමින් පවතී. |
| 03 | ආදර්ශ පළාත් පාලන ආයතනය පිළිබඳ වැඩමුළුව | 01 | වැඩසටහන සාර්ථකව අවසන් කර ඇත. |
| 03 | පළාත් පාලන සඟරාව (සිංහල) | 01 | මුද්‍රණයේ පවතී. |
| 04 | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | වැඩසටහන සාර්ථකව අවසන් කර ඇත. |

## මූල්‍ය කළමනාකරණ අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| **01** | රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අනුව පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම හා ප්‍රායෝගික පුහුණු වැඩමුළුව | **09** | **15** ( UNDP ආයතයේ මූල්‍ය අනුග්‍රහය මත මෙම වැඩසටහන පවත්වා ඇත.) | **750** |
| **02** | පළාත් පාලන ආයතන සඳහා අයවැය සම්පාදනය පිළිබඳ වැඩමුළුව | **09** | **09** | **380** |

## පරිගණක අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| **01** | පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා කාර්යක්ෂම සන්නිවේදනයක් සඳහා රාජ්‍ය තැපැල් ජාලයන් හා **viber / whatsapp** තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව. | **09** | **09** | **389** |

| | | | | |
|---|---|---|---|---|
| 02 | පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා පරිගණක භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව. | 09 | 09 | 382 |
| 03 | පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා දත්ත ආරක්ෂණය හා පරිගණක භාවිතයේ නෛතික තත්වය පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුව. | 09 | 11 | 420 |
| 04 | පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා පරිගණක යෙදවුම් පිළිබඳ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 01 | 30 |

## පුහුණු හා අධ්‍යයන අංශය

| අංකය | වැඩමුළුවේ නම | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පැමිණි පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 අධ්‍යන වර්ෂය | 01 | 01 | 60 |
| 02 | පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2017/2018 අධ්‍යයන වර්ෂය | 01 | 01 | 65 |
| 03 | පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019 අධ්‍යයන වර්ෂය | 01 | 01 | 75 |
| 04 | පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019 අධ්‍යයන වර්ෂය | 01 | 01 | 75 |
| 05 | ප්‍රජා සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019 | 01 | 01 | 30 |
| 06 | මහජන නියෝජිතයන් සඳහා වූ පළාත් පාලනය පිළිබඳ මූලික සහතිකපත්‍ර පාඨමාලාව | 02 | 02 | 74 |
| 07 | පළාත් පාලන කළමණාකරණය සංවර්ධන හා පුහුණු ආයතන සම්බන්ධීකරණ වැඩමුළුව. | 04 | 04 | 40 |
| | ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා වූ රැස්වීම | 04 | 04 | 250 |
| 09 | පළාත් පාලනය පුවත්පත - සිංහල / දෙමළ | 04 | 04 | සියලුම පළාත් පාලන ආයතන |
| 10 | ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් සඳහා සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීම | 45 | 50 | 2500 |

# 2018 වර්ෂයේ ගමන්මග

## වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2018

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා ගරු අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමා , ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උප කුලපති සම්පත් අමරතුංග මහතා හා පළාත් සභා පළාත් පාලනහා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් කමල් පත්මසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බන්ඩාරණායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2018 ඔක්තෝම්බර් මස 18 වන දින පැවැත්විණි.


# 3.12. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

## හැඳින්වීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කර ඇති අතර වර්තමානයේ පළාත් සභා පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම අරමුදල දැනට පළාත් පාලන ආයතනවල දිගුකාලීන ආදායම් උත්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිවලට මූල්‍ය සවිය ලබාදෙන ප්‍රධානම රාජ්‍ය ආයතනය වේ.

## අරමුදලේ ප්‍රධාන කාර්ය භාරය

දැනට ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කර ඇති මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ද ඇතුළුව සියළුම පළාත් පාලන ආයතන 341 සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී අනුපාතයක් යටතේ සැපයීම අරමුදලේ මූලික කාර්ය භාරය වේ.






| ණය අනුමත කිරීම - 2018 | | | | |
|---|---|---|---|---|
| අනු අංක | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම |
| 01 | අනුරාධපුර | ම.න.ස | යන්ත්‍ර උපකරණ මිලට ගැනීම | 20,000,000.00 |
| 02 | මහනුවර | ම.න.ස | වාහන අංගනය සහිත සුපිරි වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 1,000,000,000.00 |
| 03 | දෙහිවල ගල්කිස්ස | ම.න.ස | ජාල ගත කිරීම | 10,000,000.00 |
| 04 | ජා ඇල | න.ස | වීදි පහන් නඩත්තු රථයක් මිලදී ගැනීම | 2,834,400.00 |
| 05 | තිරුප්පනේ | ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 10,000,000.00 |
| 06 | අක්මීමන | ප්‍රා.ස | බැකෝ ලෝඩරයක් මිල දී ගැනීම | 10,000,000.00 |
| 07 | කඹුරුපිටිය | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 4,800,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| **08** | බද්දේගම | ප්‍රා.ස | බැකෝ ලෝඩරයක් මිල දී ගැනීම | **9,600,000.00** |
| **09** | හක්මන | ප්‍රා.ස | බැකෝ ලෝඩරයක් මිල දී ගැනීම | **9,600,000.00** |
| **10** | කින්නියා | ප්‍රා.ස | බැකෝ ලෝඩරයක් මිල දී ගැනීම | **10,000,000.00** |
| **11** | දෙහිඅත්තකණ්ඩිය | ප්‍රා.ස | නාගරික උද්‍යානය | **4,000,000.00** |
| **12** | කහටගස්දිගිලිය | ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය නවීකරනය කිරීම | **4,625,200.00** |
| **13** | වැලිගෙපොල | ප්‍රා.ස | පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම | **19,920,000.00** |
| එකතුව | | | | **1,115,379,600.00** |

ණය නිකුත් කිරීම - 2018

| අනු අංක | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම |
|---|---|---|---|---|
| 1 | බිංගිරිය | ප්‍රා.ස. | බැකෝ ලෝඩරයක් මිල දී ගැනීම | 7,000,000.00 |
| 2 | මීගමුව | ම.න.ස | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 6,526,000.00 |
| 3 | කාරතිව් | ප්‍රා.ස. | සංස්කෘතික මධ්‍යස්ථානයේ පැති බැම්ම ඉදිකිරීම | 1,777,911.00 |
| 4 | බලපිටිය | ප්‍රා.ස. | ආදහනාගාරය ඉදිකිරීම | 1,252,971.00 |
| **5** | දෙහිඕවිට | ප්‍රා.ස. | ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,794,665.00 |
| **6** | පස්සර | ප්‍රා.ස. | වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | **17,221,000**.00 |
| **7** | නාවිදන්වෙලි | ප්‍රා.ස. | මෘත ශරීර ප්‍රවාහන රථය මිලදී ගැනීම | 1,120,000.00 |
| 8 | මීගමුව | ම.න.ස | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | **28,481,805.34** |
| 9 | මහනුවර | ම.න.ස | වාහන අංගනය සහිත සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | **317,184,000.00** |
| 11 | අනුරාධපුරය | ම.න.ස | යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 20,000,000.00 |
| **18** | කන්දෙකැටිය | ප්‍රා.ස | සති පොළ නවීකරණය සඳහා | **783,800.00** |
| එකතුව | | | | **403,142,152.34** |





## ප්‍රචාරණ වැඩසටහන්

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අලෙවි ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස පළාත් සභා පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් ''ණය පොල'' සංකල්පය 2017 වසරේ හඳුන්වා දුන් අතර 2018 වසර තුල ණයපොල 03 ක් උතුර, මධ්‍යම සහ දකුණු යන පළාත් වල සාර්ථකව පවත්වන්නට යෙදුණි.

## ණය අයකිරීම හා මහා භාණ්ඩාගාරයට ගෙවීම




## ණය අය නොවන ව්‍යාපෘති

අය නොවන ණය සම්බන්ධයෙන් 2018 වසර තුල කරන ලද සාකච්ඡා හා පසු විපරම් වල ප්‍රථිඵලයක් වශයෙන් වර්ෂ අවසානය වන විට අය නොවන ණය ප්‍රතිශතයින් යම් ප්‍රමාණයක් අය කර ගැනීමට හැකිවී ඇත.

| | | |
|---|---|---|
| 2018/01/01 දිනට අය නොවන ණය ව්‍යාපෘති | - | 467,292,230.87 |
| පළමු කාර්තුව අවසානයේ අයකරගත් ප්‍රමාණය | - | - |
| දෙවන කාර්තුව අවසානයේ අයකරගත් ප්‍රමාණය | - | - |
| තෙවන අවසානයේ අයකරගත් ප්‍රමාණය | - | 39,834,935.00 |
| සිවුවන කාර්තුව අවසානයේ අයකරගත් ප්‍රමාණය | - | 15,349,318.88 |
| සිවුවන කාර්තුව අවසානයේ අයකර ගත් අය නොවන ණය ශේෂය ප්‍රතිශතයක් ලෙස | - | 11.82% |